ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

# රාජ්‍ය මූල්‍ය කළමනාකරණ

**වඩා යහපත් වූ සාර්ව ආර්ථික කළමනාකරණයක් උදෙසා මූල්‍ය ප්‍රතිපත්තිය වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ව්‍යුහය තුළ රාජ්‍ය අරමුදල් පිළිබඳ වගවීම, අධීක්ෂණය, කළමනාකරණය සහ පාලනය ශක්තිමත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; මූල්‍ය කළමනාකරණයට අදාළ ආයතනික වගකීම් පැහැදිලි කිරීම සඳහා ද; අයවැය කළමනාකරණය ශක්තිමත් කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපත්තිය සහ කාර්යසාධනය මහජනතාව විසින් සුපරීක්ෂණයට ලක්කිරීම සඳහා පහසුකම් සැලැස්වීම සඳහා ද; 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ 8 වන හා 14 වන වගන්ති ඉවත් කිරීම සඳහා ද; 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත ඉවත් කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා විසින්
2024 මැයි මස 22 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2024 මැයි මස 14 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

[259 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 108.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# රාජ්‍ය මූල්‍ය කළමනාකරණ

එල්. ඩී.- ඕ. 48/2023

**වඩා යහපත් වූ සාර්ව ආර්ථික කළමනාකරණයක් උදෙසා මූල්‍ය ප්‍රතිපත්තිය වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ව්‍යුහය තුළ රාජ්‍ය අරමුදල් පිළිබඳ වගවීම, අධීක්ෂණය, කළමනාකරණය සහ පාලනය ශක්තිමත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; මූල්‍ය කළමනාකරණයට අදාළ ආයතනික වගකීම් පැහැදිලි කිරීම සඳහා ද; අයවැය කළමනාකරණය ශක්තිමත් කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපත්තිය සහ කාර්ය සාධනය මහජනතාව විසින් සුපරීක්ෂණයට ලක්කිරීම සඳහා පහසුකම් සැලැස්වීම සඳහා ද; 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ 8 වන හා 14 වන වගන්ති ඉවත් කිරීම සඳහා ද; 2003 අංක 3 දරන මූල්‍ය කලමනාකරණ (වගකීම) පනත ඉවත් කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැළැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය

1. (1) මේ පනත 2024 අංක  දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති විධිවිධාන හැර මේ පනතේ සියලු විධිවිධාන මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත්වන දිනයේ සිට බලාත්මක විය යුතු ය.

(3) මේ උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් දිනයක් හෝ දිනයන් මුදල් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය යුතු ය:-

(අ) 11 වන වගන්තියේ (5) වන උපවගන්තියේ (ඊ) ඡේදයේ විධිවිධාන, 17 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන, 18 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන, 36 වන වගන්තියේ විධිවිධාන සහ 47 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන බලාත්මක විය යුතු දිනය හෝ දිනයන්:

එසේ වුව ද, 11 වන වගන්තියේ (5) වන උපවගන්තියේ (ඊ) ඡේදයේ විධිවිධාන ක්‍රියාත්මක විය යුතු දිනය 2025 ජුනි මස තිස්වන දිනට පසු නොවන්නා වූ දිනයක් විය යුතු ය; සහ

(ආ) 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ (ii) වන අනුඡේදයේ නිශ්චිතව දක්වා ඇති අස්ථිත්වයක් සම්බන්ධයෙන් 34 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වන දිනය.

පනතේ අරමුණු

**2.** මේ පනතේ අරමුණු පහත දැක්වෙන පරිදි විය යුතු ය:-

(අ) රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කිරීමේ දී ආදායම්, වියදම්, වගකීමට බැඳීම, මූල්‍යයනය කිරීම, රජයේ කොටස් අයිතිය, වත්කම් සහ බැරකම් පිළිබඳ විනිවිදභාවය, වගවීම, විනය, ඵලදායිතාවය, කාර්යක්ෂමතාවය සහ අරපිරිමැස්ම සඳහා ප්‍රමිති, නියමයන්, රීති සහ කාර්ය පටිපාටි සකස් කිරීම;

(ආ) රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කිරීමේ දී මූල්‍ය වගවීම සඳහා වූ අරමුණු හා රීති ක්‍රියාත්මක කිරීම ඇතුළුව වාර්ෂික අයවැය සැළසුම් කිරීම, සකස් කිරීම, සම්මත කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අධීක්ෂණය කිරීම, ඇගයීම, අභ්‍යන්තර පාලනය, ගිණුම්කරණය සහ වාර්තා කිරීම සඳහා අනුගමනය කළ යුතු නියමයන් සහ කාර්යපටිපාටි නිශ්චිතව දැක්වීම; සහ

(ඇ) කාර්යසාධන සහ වගවීම් නියමයන් නිශ්චිතව දැක්වීම.

## **I** වන කොටස

## **පනත අදාළවීම**

මේ පනතේ විධිවිධානවල අදාළත්වය

**3.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 ,151 සහ 152 යන ව්‍යවස්ථාවල විධිවිධානවලට අමතරව මේ පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් සහ විධානයක් මේ පනත මගින් විශේෂයෙන් බැහැර කර ඇත්නම් මිස, රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ විය යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන පහත නිශ්චිතව දක්වා ඇති අස්ථිත්වයන්ට සහ තැනැත්තන්ට අදාළ විය යුතු ය:-

(අ) (මෙහි මින්මතු "රාජ්‍ය අස්ථිත්ව" යනුවෙන් සඳහන් කරනු ලබන) පහත දැක්වෙන අස්ථිත්වයන්:-

(i) අයවැය අස්ථිත්ව;

(ii) රජයේ මුදල් වෙන් කරනු ලබන ව්‍යවස්ථාපිත අරමුදල් සහ භාර;

(iii) රජයට අයත් ව්‍යවසායයන්; සහ

(iv) අදාළ ලිඛිත නීතීන්හි විධිවිධාන ප්‍රකාරව පළාත් සභා යටතේ ක්‍රියාත්මක වන පළාත් සභා, පළාත් අමාත්‍යාංශ, පළාත් දෙපාර්තමේන්තු සහ වෙනත් ආයතන සහ පළාත් පාලන ආයතන;

(ආ) පහත දැක්වෙන තැනැත්තන්:-

(i) රජයේ නිලධාරීන්;

(ii) රජයේ තනතුරු දරන්නන්;

(iii) ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයින්; සහ

(iv) අධිකරණ සේවයේ සාමාජිකයින්.

(3) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා, මේ පනත අදාළ වන (2) වන උපවගන්තියේ සඳහන් සෑම රාජ්‍ය අස්ථිත්වයක් ම, යම් ලිඛිත නීතියක් යටතේ එම රාජ්‍ය අස්ථිත්වයට වෙන් කරන ලද හෝ එම රාජ්‍ය අස්ථිත්වය විසින් අයකරගන්නා ලද රාජ්‍ය අරමුදල් කළමනාකරණය කිරීමේ දී මේ පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

## **II** වන කොටස

## මුදල් අමාත්‍යවරයාගේ සහ වෙනත් බලධාරීන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

මේ පනත යටතේ මුදල් අමාත්‍යවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

**4.** (1) (මේ පනතේ "මුදල් අමාත්‍යවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථා යටතේ මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 වන ව්‍යවස්ථාව යටතේ පවරා ඇති බලතලවලට අමතරව පහත දැක්වෙන කාරණා සඳහා වගකිව යුතු ය:-

(අ) මූල්‍ය අවදානම් පිළිබඳ මූලාශ්‍ර හඳුනාගැනීම ඇතුළුව මූල්‍ය තිරසරභාවය සහ ඵලදායි කළමනාකරණය සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීම සහ ඊට අදාළ තොරතුරු පළකිරීම;

(ආ) මේ පනතේ III වන කොටස යටතේ මූල්‍ය වගකීම් නියමයන්ට අනුකූලවන බවට සහතිකවීම;

(ඇ) ආදායම් එකතු කර ගැනීම, වියදම් කළමනාකරණය, රාජ්‍ය ණය සහ ආණ්ඩුවේ මුදල් සහ ද්‍රවශීල තත්ත්වය පූර්ණව අධීක්ෂණය කිරීම ඇතුළුව වාර්ෂික අයවැය පිළියෙල කිරීම, කළමනාකරණය කිරීම සහ එහි ක්‍රියාත්මකභාවය අධීක්ෂණය කිරීම;

(ඈ) රජයට අයත් ව්‍යවසාය සම්බන්ධයෙන් නියම කළ හැකි ප්‍රමාණයට, මූල්‍ය අධීක්ෂණය ඇතුළුව ආණ්ඩුවේ සියළු මූල්‍ය මෙහෙයුම් පොදු අධීක්ෂණයට ලක් කිරීමත සහ

(ඉ) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම.

(2) මුදල් අමාත්‍යවරයා විසින්-

(අ) මේ පනත මගින් හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් මුදල් අමාත්‍යවරයා වෙත පවරනු ලැබ ඇති වෙනත් යම් බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම කළ යුතු ය; සහ

(ආ) මේ පනතේ විධිවිධාන සහ මේ පනත යටතේ සාදන ලද නියෝග ඵලදායි ලෙස අදාළ කරගැනීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වගකිව යුතු ය.

(3) මේ පනතේ 28 වන වගන්තියේ (1) වන උපවගන්තිය, 32 වගන්තියේ (3) වන උපවගන්තිය, 39 වගන්තියේ (4) වන උපවගන්තිය, 56 වන වගන්තිය සහ 67 වන වගන්තිය යටතේ හැර, මේ පනත මගින් මුදල් අමාත්‍යවරයා වෙත පවරනු ලැබ ඇති යම් බලයක්, මුදල් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් එම නියමයේ නිශ්චිතව දක්වෙන කොන්දේසිවලට, විශේෂ නියමයන්ට සහ සීමා කිරීම්වලට යටත්ව භාණ්ඩාගාරයේ ලේකම්වරයාට පවරනු ලැබිය හැකි ය.

**භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය**

**5.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52 වන ව්‍යවස්ථාවේ (1) වන ඡේදය ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා (මේ පනතේ "භාණ්ඩාගාරයේ ලේකම්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) මහා භාණ්ඩාගාරයේ ප්‍රධානියා විය යුතු ය.

(2) වෙනත් යම් ලිඛිත නීතියක් මගින් පවරනු ලැබ ඇති බලතල, කාර්ය, කර්තව්‍ය සහ වගකීම්වලට අමතරව මේ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සඳහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාට පහත දැක්වෙන බලතල, කාර්ය, කර්තව්‍ය සහ වගකීම් තිබිය යුතු ය:-

(අ) මේ පනත යටතේ තම කර්තව්‍ය ඉටු කිරීම සඳහා මුදල් අමාත්‍යවරයාට සහයවීම;

(ආ) වාර්ෂික අයවැය පිළියෙල කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් අමාත්‍යවරයාට සහයවීම;

(ඇ) භාණ්ඩාගාරයේ මුදල් ප්‍රවාහය කළමනාකරණය කිරීම සහ භාණ්ඩාගාර කේවල ගිණුම යටතේ පවත්වාගෙන යනු ලබන නිල බැංකු ගිණුම් කළමනාකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම;

(ඈ) ආණ්ඩුවේ වාර්තා සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී සහ එම වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමේ දී සහ අදාළ තොරතුරු මහජනතාව වෙත ලබා දීමේ දී ව්‍යවස්ථාපිත නියමයන්ට අනුකූලව ක්‍රියා කරන බවට සහතිකවීම;

(ඉ) රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති සහ රාජ්‍ය - පෞද්ගලික හවුල්ව්‍යාපාර ව්‍යාපෘතිවල ක්‍රියාත්මකවීම, අධීක්ෂණය කිරීම සහ ඒවායේ ප්‍රතිඵල ඇගයීම;

(ඊ) රජයට අයත් ව්‍යවසායන්හි ඵලදායි කළමනාකරණය සහ සමස්ථ අධීක්ෂණය සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රමෝපාය සකස් කිරීම;

(උ) ජාතික පාරිශ්‍රමික ප්‍රතිපත්තීන්ට අනුකූලව රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාව සහ පාරිශ්‍රමික කළමණාකරණය කිරීමට මුදල් අමාත්‍යවරයාට සහයවීම;

(ඍ) රාජ්‍ය අස්ථිත්වයන්හි මූල්‍ය කළමනාකරණය, වත්කම් කළමනාකරණය සහ අභ්‍යන්තර විගණන කළමනාකරණය සඳහා විධාන සකස් කිරීම, වැඩිදියුණු කිරීම, සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම;

(එ) අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය මත ආණ්ඩුව වෙනුවෙන් විදේශීය රජයන්, ජාත්‍යන්තර සංවිධාන සහ වෙනත් දායකත්ව සපයන ලබාදෙන නියෝජ්‍යායතන සමග ගිවිසුම්වලට එළඹීම; සහ

(ඒ) මේ පනත යටතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත පවරනු ලැබ ඇති මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන වෙනත් යම් බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම.

භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය පැවරීම

**6.** (1) මේ පනතේ 5 වන වගන්තිය යටතේ භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත පවරනු ලැබ ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින්, ලිපියක් මගින් එම ලිපියේ සඳහන් කොන්දේසිවලට යටත්ව නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරයාට හෝ භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂ ජනරාල්වරයකුගේ නිලයට නොඅඩු නිලයක සිටින නිලධරයෙකුට පවරනු ලැබිය හැකි ය.

(2) භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් බලය පැවරීමක් නොතකා, එසේ පවරනු ලැබ ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය තමා විසින් ම ක්‍රියාත්මක කල හැකි අතර, එවැනි යම් බලය පැවරීමක් කවර හෝ අවස්ථාවක දී ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබිය හැකි ය.

(3) භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ ධූර දැරීම නතර වීම නොතකා, (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් බලය පැවරීමක් තවදුරටත් බලාත්මක විය යුතු ය.

ප්‍රධාන ගණන්දීමේ නිලධරයා ආදීන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

**7.** ප්‍රධාන ගණන්දීමේ නිලධරයාගේ, ගණන් දීමේ නිලධරයාගේ සහ ආදායම් ගණන්දීමේ නිලධරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය නියම කරනු ලබන පරිදි විය යුතු ය.

ආදායම් කළමනාකරණ කමිටුව

**8.** (1) මුදල් අමාත්‍යවරයා විසින් (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති සාමාජිකයන්ගෙන් සමන්විත ආදායම් කළමනාකරණ කමිටුවක් පත් කරනු ලැබිය යුතු අතර, එම කමිටුව පහත දැක්වෙන කාර්ය සඳහා වගකිව යුතු ය:-

(අ) 11 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශයට අනුකූලව ආදායම් ක්‍රමෝපාය සම්පාදනය කිරීම සහ වැඩිදියුණු කිරීම; සහ

(ආ) ආදායම් උපදවන රාජ්‍ය අස්ථිත්වයන්ට ක්‍රමෝපාය උපදෙස් ලබාදීම.

(2) ආදායම් කළමනාකරණ කමිටුව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:-

(අ) පහත දැක්වෙන නිලබලයෙන් පත්වන සාමාජිකයන් එනම්-

(i) සභාපතිවරයා විය යුතු භාණ්ඩාගාරයේ ලේකම්වරයා;

(ii) මූල්‍ය ප්‍රතිපත්ති විෂයය භාරව සිටින භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා;

(iii) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා;

(iv) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(v) සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා;

(vi) භාණ්ඩාගාර මෙහෙයුම් විෂයය භාරව ඇති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(vii) මූල්‍ය ප්‍රතිපත්ති විෂයය භාරව ඇති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා; සහ

(ආ) ආදායම් කළමනාකරණය පිළිබඳ විෂයය ක්ෂේත්‍රයේ නිපුණත්වයන් සහිත තැනැත්තන් අතරින් මුදල් අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන වෙනත් සාමාජිකයන් දෙදෙනෙක්.

(3) භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන මූල්‍ය ප්‍රතිපත්ති විෂයය සම්බන්ධයෙන් වගකිව යුතු දෙපාර්තමේන්තුවේ නිලධරයකු ආදායම් කළමනාකරණ කමිටුවේ ලේකම්වරයා විය යුතු ය.

(4) ආදායම් කළමනාකරණ කමිටුවට පත්කළ සාමාජිකයකු මුදල් අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් එම කමිටුවෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, ආදායම් කළමනාකරණ කමිටුවේ පත්කළ සාමාජිකයකු වසර තුනක කාලසීමාවක් සඳහා එම කමිටුවේ සේවය කළ යුතු අතර නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(6) ආදායම් කළමනාකරණ කමිටුවේ කර්තව්‍ය සහ ආදායම් වර්ගීකරණය කිරීමේ ක්‍රමය, ආදායම් එකතු කිරීම සහ තැන්පත් කිරීම, ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කිරීම සහ වාර්තා කිරීමේ අවශ්‍යතා යන කරුණු නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(7) ආදායම් කළමනාකරණ කමිටුව විසින් ක්‍රියාත්මක කරනු ලබන කර්තව්‍යන් සහ 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති රාජ්‍ය අස්ථිත්වයන් විසින් ක්‍රියාත්මක කරනු ලබන කර්තව්‍යයන් අතර යම් ගැටුමක් නිර්මාණය නොවන ආකාරයට, යම් අදාළ ලිඛිත නීතින්ට යටත් ව, ආදායම් කළමනාකරණ කමිටුව ක්‍රියා කළ යුතු ය.

## III වන කොටස

### මූල්‍ය කළමනාකරණ වගකීම

ආණ්ඩුවේ මූල්‍ය කළමනාකරණ වගකීම

**9.** සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ රටේ ආර්ථික වර්ධනය සහ පරම්පරා අතර සාධාරණත්වය යන කරුණු පිළිබඳ සහතිකවීම පිණිස ආණ්ඩුව විසින් ස්වකීය මූල්‍ය ප්‍රතිපත්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව වගවීම් සහිත, කාර්යක්ෂම, සාධාරණ, විනිවිදභාවයෙන් යුතු සහ තිරසර ආකාරයට කළමනාකරණය කළ යුතු ය.

වගකිව යුතු මූල්‍ය කළමනාකරණයට අදාළ අරමුණු

**10.** ආණ්ඩුව විසින් අනුකූලව ක්‍රියා කළ යුතු වගකීම් සහිත මූල්‍ය කළමනාකරණයට අදාළ අරමුණු පහත දැක්වෙන පරිදි විය යුතු ය:-

(අ) රාජ්‍ය ණය අඩුකර තිරසර මට්ටමකට පවත්වාගෙන යන බවට සහතිකවීම;

(ආ) අනාගත මූල්‍ය කම්පනයන්ගෙන් ආරක්ෂාවීම සඳහා ආරක්ෂිත මූල්‍ය සංචිත ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම;

(ඇ) මූල්‍ය අවදානම් විචක්ෂණශීලිව කළමනාකරණය කිරීම සහ අවම කිරීම;

(ඈ) මූල්‍ය කළමනාකරණයේ දී විනය, විනිවිදභාවය සහ වගවීම පිළිබඳව සහතිකවීම;

(ඉ) වාර්ෂික මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශයක් සහ පස් අවුරුදු චක්‍රීය මධ්‍ය කාලීන මූල්‍ය රාමුවක් වැඩිදියුණු කිරීම සහ පළකිරීම සඳහා අවශ්‍යතා ස්ථාපිත කිරීම මගින් මූල්‍ය සැලසුම්කරණයේ කාලමානයන් පුළුල් කිරීම; සහ

(ඊ) ආණ්ඩුවේ මූල්‍ය කාර්යසාධනය ඵලදායි ලෙස සුපරික්ෂාවට ලක්කිරීම සඳහා පහසුකම් සැලසීම.

මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය

**11.** (1) 10 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අරමුණු සාක්ෂාත් කර ගන්නා බවට සහතිකවීම සඳහා මේ කොටසේ නිශ්චිතව දක්වා ඇති මූල්‍ය වගකීම් ආණ්ඩුවේ මූල්‍ය ක්‍රමෝපාය අනුකූල විය යුතු අතර, එම අරමුණු මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ සඳහන් කළ යුතු ය.

(2) මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය මුදල් අමාත්‍යවරයා විසින් වාර්ෂිකව පිළියෙල කරනු ලැබිය යුතු අතර, එය අනුමතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා ගැනිමෙන් පසු, එක් එක් වර්ෂයේ ජූනි මස තිස්වන දින හෝ එදිනට පෙර මුදල් අමාත්‍යවරයා විසින් මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය පාර්ලිමේන්තුවේ දී නිවේදනය කළ යුතු ය. ඉදිරි වර්ෂයේ වාර්ෂික අයවැය, එම මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය මත පදනම්ව සකස් කළ යුතු ය. මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය මුදල් අමාත්‍යවරයා විසින් නිවේදනය කිරීමෙන් අනතුරුව මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය.

(4) මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශයේ කාර්ය පහත දැක්වෙන පරිදි විය යුතු ය :-

(අ) වාර්ෂික අයවැය පිළියෙල කිරීමට පෙර ආණ්ඩුවේ මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ විධිමත් ප්‍රකාශයක් පාර්ලිමේන්තුව වෙත සහ මහජනතාව වෙත ඉදිරිපත් කිරීම;

(ආ) එළඹෙන වර්ෂයට අදාළ වාර්ෂික අයවැය සඳහා ක්‍රමෝපාය මාර්ගෝපදේශ සැපයීම;

(ඇ) මූල්‍ය කාර්යසාධනය වාස්තවික ලෙස ඇගයීමේ පදනම පිහිටුවීම;

(ඈ) ආණ්ඩුවේ මූල්‍ය ක්‍රමෝපායෙහි කාර්යසාධනය පිළිබඳව වන පාර්ලිමේන්තුවේ අධීක්ෂණය ශක්තිමත් කිරීම; සහ

(ඉ) මූල්‍ය විනිවිදභාවය සහ වගවීම වැඩි කිරීම.

(5) මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශයේ අවම වශයෙන් -

(අ) ආණ්ඩුවේ මූල්‍ය ඉලක්ක, සහ එම ඉලක්ක සපුරාලීම සහතික කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්ති නිශ්චිතව දැක්විය යුතු ය;

(ආ) රාජ්‍ය ණය තිරසර මට්ටමකට අඩු කිරීම සඳහා යෝජිත කාලසීමාව ඇතුළත් කර තිබිය යුතු ය;

(ඇ) ආණ්ඩුවේ මූල්‍ය ඉලක්ක සහ ප්‍රතිපත්ති වගකීම් සහිත මූල්‍ය කළමනාකරණයේ අරමුණු සමග අනුගත වන්නේ කෙසේද යන්න පැහැදිලි කළ යුතු ය;

(ඈ) 12 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති මධ්‍ය කාලීන මූල්‍ය රාමුව ඇතුළත් කර තිබිය යුතු ය;

(ඉ) පහත දක්වෙන කරුණු ඇතුළුව රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායෙහි කාර්ය සාධනය පිළිබඳ ඇගයීමක් ලබාදිය යුතු ය:-

(i) මූල්‍ය ඉලක්කවලට අනුකූල නොවීම පිළිබඳ පැහැදිලි කිරීමක් ඇතුළත්ව පෙර මුදල් වර්ෂයේ මූල්‍ය ඉලක්කවලට අනුකූලවීම පිළිබඳ ඇගයීමක්;

(ii) පවත්නා මුදල් වර්ෂයේ අපේක්ෂිත මූල්‍ය ඉලක්කවලට අනුකූලවීම පිළිබඳ ඇගයීමක්;

(iii) ඉදිරි මුදල් වර්ෂය සහ එළඹෙන පසුව මුදල් වර්ෂ හතරක් සඳහා අපේක්ෂිත මූල්‍ය ඉලක්කවලට අනුකූලවීම පිළිබඳ ඇගයීමක්; සහ

(iv) පවත්නා මුදල් වර්ෂය සඳහා සහ ඉදිරි මුදල් වර්ෂය සඳහා මූල්‍ය ඉලක්කවලට අනුකූල නොවීමේ අවදානම පිළිබඳ ඇගයීමක්;

(ඊ) 10 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අරමුණු සාක්ෂාත් කරගැනීමේ දී බාධාවිය හැකි මූල්‍ය අවදානම්වල ප්‍රධාන ප්‍රභවයන් නිශ්චිතව දැක්වීම සහ එම මූල්‍ය අවදානම්වල මූල්‍යමය බලපෑම තක්සේරු කිරීම; සහ

(උ) පසුගිය වසර තුන ඇතුළත ගනු ලැබූ මූල්‍ය තීරණවල සාර්ව ආර්ථික බලපෑම හෙළිදරව් කිරීම.

මධ්‍ය කාලීන මූල්‍ය රාමුව

**12.** (1) 11 වන වගන්තියේ සඳහන් මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය තුළ අනුමත කර, පළ කළ යුතු, මධ්‍ය කාලීන මූල්‍ය රාමුවක් එළඹෙන මුදල් වර්ෂය සඳහා සහ එළඹෙන මුදල් වර්ෂ හතර සඳහා පිළියෙල කරනු ලබන බවට මුදල් අමාත්‍යවරයා විසින් තහවුරු කරනු ලැබිය යුතු ය.

(2) මධ්‍ය කාලීන මූල්‍ය රාමුවක අවම වශයෙන් පහත දැක්වෙන කරුණු ඇතුළත් විය යුතු ය:-

(අ) පුරෝකථනය කරන ලද නාමික දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් ප්‍රකාශිත ආණ්ඩුවේ ණය අවම කිරීමේ අරමුණු සහ අනුගත ප්‍රාථමික ශේෂ ඉලක්කයක්;

(ආ) 15 වන වගන්තිය යටතේ ගණනය කරන ලද ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රකාශිත, ආණ්ඩුවේ ප්‍රාථමික වියදම් සීමාව; සහ

(ඇ) පස් අවුරුදු චක්‍රීය කාලමානයක් සඳහා ආණ්ඩුවේ සමුච්චිත මූල්‍ය පුරෝකථනයන් සහ අතිරේක ඉලක්කයන් මෙම පුරෝකථන සඳහා යොදාගන්නා ලද ආර්ථික සහ වෙනත් උපකල්පනයන්.

(3) රාජ්‍ය ණයවල තිරසර මට්ටම සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සඳහා, මධ්‍ය කාලීන මූල්‍ය රාමුව තුළ 14 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි වාර්ෂික ප්‍රාථමික ශේෂ ඉලක්කයක් සහ 15 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි ප්‍රාථමික වියදම් සීමාව තීරණය කළ යුතු ය.

(4) වාර්ෂික අයවැය, (2) වන උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන මධ්‍ය කාලීන මූල්‍ය රාමුවේ අන්තර්ගත ප්‍රාථමික ශේෂ ඉලක්කය සහ ප්‍රාථමික වියදම් සීමාව සමග අනුකූල විය යුතු ය.

ණය අඩුකිරීමේ අරමුණ

**13.** (1) 10 වන වගන්තියේ (අ) ඡේදයේ සඳහන් ණය අඩුකිරීමේ අරමුණ සඳහා 11 වන වගන්තියේ (5) වන උපවගන්තියේ (ආ) ඡේදය ප්‍රකාරව මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ නිශ්චිතව දක්වා ඇති සීමාවන් සහ කාලරාමු වලට අනුගත වෙමින් රාජ්‍ය ණය අඩු කර තිරසර මට්ටමකට පවත්වා ගත යුතු බවට ආණ්ඩුව සහතිකවීම අපේක්ෂා කෙරේ.

(2) මූල්‍ය කාර්යසාධනය සහ පිළිවෙලින් 11 වන සහ 12 වන වගන්තිවල නිශ්චිතව දක්වා ඇති මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශයට හෝ මධ්‍ය කාලීන මූල්‍ය රාමුව තුළ අවශ්‍ය විය හැකි ප්‍රතිශෝධන ඇතුළත් කරමින් මුදල් අමාත්‍යවරයා විසින් වාර්ෂික පදනමක් මත ණය පිළිබඳ තිරසරකරණ විශ්ලේෂණයක් සකස් කොට පළ කරනු ලැබීම සහතික කළ යුතු ය.

ප්‍රාථමික ශේෂ ඉලක්ක

**14.** (1) ණය අඩුකිරීමේ අරමුණට අනුකූලව ඊලඟ මුදල් වර්ෂය සහ එලඹෙන පසුව මුදල් වර්ෂ හතර සඳහා වන මධ්‍ය කාලීන මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ අමාත්‍යවරයා විසින් දක්වා ඇති ප්‍රාථමික ශේෂ ඉලක්කය -

(අ) මූල්‍ය සැළසුම්කරණයේ සහ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ සියලු පැතිකඩ ආවරණය වන පරිදි මධ්‍ය කාලීන මූල්‍ය නැංගුරමක් ලෙස ක්‍රියා කළ යුතු ය; සහ

(ආ) නිරීක්ෂණය කරන ලද මූල්‍ය ප්‍රථිඵල පිළිඹිබු වන ආකාරයෙන් සහ 10 වන වගන්තියේ සඳහන් ණය අඩු කිරීමේ අරමුණු සමග අනුකූලතාව සහතික වන ආකාරයෙන් වාර්ෂිකව යාවත්කාලීන කළ යුතු ය.

(2) මධ්‍ය කාලීන මූල්‍ය රාමුවේ ඇතුළත් කර ඇති ප්‍රාථමික ශේෂ ඉලක්ක සමග අනුකූල නොවීමේ දී හෝ අනුකූල නොවනු ඇතැයි අපේක්ෂා කිරීමේ දී මුදල් අමාත්‍යවරයා විසින් අවස්ථාවෝචිත පරිදි අනුකූල නොවීමේ දින හෝ අනුකූල නොවනු ඇතැයි අපේක්ෂිත දින සිට සති හයක් ඇතුළත පහත දැක්වෙන ලේඛන පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය:-

(අ) ප්‍රාථමික ශේෂ ඉලක්කය සමග අනුකූල නොවීමට හේතු පැහැදිලි කරමින් ඇගයීම් වාර්තාවක්;

(ආ) යාවත්කාලීන කරන ලද මධ්‍ය කාලීන මූල්‍ය රාමුවක්; සහ

(ඇ) ප්‍රාථමික ශේෂ ඉලක්කයට අනුකූල නොවන අවස්ථාවක දී, පවත්නා මුදල් වර්ෂයේ දී සහ ඉදිරි මුදල් වර්ෂයේ දී ප්‍රාථමික ශේෂ ඉලක්කය නැවත ළඟාකර ගැනීමට ඇති මූල්‍ය සැලැස්ම.

ආණ්ඩුවේ ප්‍රාථමික වියදම්

**15.** (1) ආණ්ඩුවේ ප්‍රාථමික වියදම් අදාළ මුදල් වර්ෂය සඳහා ඇස්තමේන්තුගත නාමික දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට දහතුනක ප්‍රතිශතයක් නොඉක්මවිය යුතු ය.

(2) මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය විසින් පුරෝකථනය කරන ලද නාමික දළ දේශීය නිෂ්පාදිතයට අනුව ගණනය කරන ලද නාමික අගයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති, එළඹෙන මුදල් වර්ෂය සහ පසුව එළඹෙන මුදල් වර්ෂ හතර සඳහා (මෙහි මින්මතු "ප්‍රාථමික වියදම් සීමාව" යනුවෙන් සඳහන් කරනු ලබන) මධ්‍ය කාලීන මූල්‍ය රාමුව තුළ නිශ්චිතව දක්වා ඇති ප්‍රාථමික වියදම් සීමාව 14 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රාථමික ශේෂ ඉලක්කය සමග අනුකූල විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ගණනය කරන ලද ප්‍රාථමික වියදම් සීමාව -

(අ) එළඹෙන මුදල් වර්ෂය සඳහා වාර්ෂික අයවැය ඉදිරිපත් කිරීම, අනුමත කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ දී වාර්ෂික අයවැය සඳහා අනුගම්‍ය විය යුතු ය.

(ආ) නාමික දළ දේශීය නිෂ්පාදිතයේ ආසන්නතම ඇස්තමේන්තුව පිළිබිඹු වන පරිදි පසුව එළඹෙන මුදල්

වර්ෂ හතර සඳහා වාර්ෂිකව යාවත්කාලීන කළ යුතු අතර, එය 14 වන වගන්තියේ නිශ්චිතව දැක්වෙන ප්‍රාථමික ශේෂ ඉලක්කය සමඟ අඛණ්ඩව අනුකූල විය යුතු ය.

(4) මේ පනත ක්‍රියාත්මකභාවයට එළඹෙන දිනයේ සිට වසර පහක දී හෝ වසර පහකට පසුව ප්‍රාථමික වියදම් සීමාව සමාලෝචනය කළ යුතු අතර, පසුව එළඹෙන සෑම වසර පහකට වරක් ම සමාලෝචනය කළ යුතු ය. එසේ ම ප්‍රාථමික ශේෂ ඉලක්කයට සහ ණය අඩුකිරීමේ අරමුණට අනුකූලව ප්‍රාථමික වියදම් සීමාව යාවත්කාලීන කළ යුතු ය.

ප්‍රාථමික වියදම් සීමාවෙන් බැහැරව ක්‍රියා කිරීම

**16.** (1) යම් මුදල් වර්ෂයක් සඳහා වූ මධ්‍ය කාලීන මූල්‍ය රාමුවේ නිශ්චිතව දක්වා ඇති ප්‍රාථමික වියදම් සීමාවෙන් බැහැරව ක්‍රියා කිරීම (2) වන උපවගන්තියේ සඳහන් අවස්ථානුගත කරුණු යටතේ පමණක් ආණ්ඩුවට කළ හැකි අතර, එසේ කටයුතු කිරීම (3) වන උපවගන්තියේ සඳහන් කාර්යපටිපාටීන්ට යටත් වන්නේ ය.

(2) අනපේක්ෂිත සිදුවීම්වලදී හෝ ජාතික ආරක්ෂාවට, ජාතික ආර්ථිකයේ ආරක්ෂාවට හෝ මහජන සෞඛ්‍යයට සහ ආරක්ෂාවට සැළකිය යුතු තර්ජනයක් සිදුකළ හැකි ස්වාභාවික ආපදාවක දී පමණක් අසම්භාව්‍ය බැරකම් සඳහා අයවැය ලේඛනයේ ඇතුළත් කර ඇති සීමාවට වඩා වැඩි මුදලක් අතිරේක, තාවකාලික සහ හඳුනාගත් වියදම් වෙනුවෙන් ආණ්ඩුවට වියදම් දැරීමට සිදුවන අවස්ථාවල දී මධ්‍ය කාලීන මූල්‍ය රාමුවේ නිශ්චිතව දක්වා ඇති ප්‍රාථමික වියදම් සීමාව ඉක්මවා ක්‍රියා කිරීමට ආණ්ඩුවට හැකියාව ඇත්තේ ය.

(3) (2) වන උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන අවස්ථාවක් පැන නැගුනහොත් හෝ පැන නැගීමට ඉඩ ඇති අවස්ථාවක දී, මධ්‍ය කාලීන මූල්‍ය රාමුවේ නිශ්චිතව දක්වා ඇති ප්‍රාථමික වියදම් සීමාව ඉක්මවා ක්‍රියා කිරීමට අවශ්‍ය වන විටක, මුදල් අමාත්‍යවරයා විසින් යෝජනා සම්මතයක් මගින් ප්‍රාථමික වියදම් සීමාවෙන් බැහැරව ක්‍රියා කිරීමට සහ මධ්‍ය කාලීන මූල්‍ය රාමුවේ නිශ්චිතව දක්වා ඇති ප්‍රාථමික වියදම් සීමාව ඉක්මවා කටයුතු කිරීම සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් සඳහා පාර්ලිමේන්තුවේ අනුමතිය ඉල්ලා සිටිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් ඉල්ලීමක් සමග අවම වශයෙන් පහත දැක්වෙන ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතු ය:-

(අ) ප්‍රාථමික වියදම් සීමාවෙන් බැහැරව ක්‍රියා කිරීමට සිදු වූ අවස්ථානුගත කරුණු සාධාරණීකරණය කිරීමක් සහ උපකාරක දත්ත ඇතුළුව එවැනි බැහැරවීමක අවශ්‍යතාවය පැන නැගීමට හේතු වූ අවස්ථානුගත කරුණු පැහැදිලි කරනු ලබන ප්‍රකාශනයක්;

(ආ) ප්‍රාථමික වියදම් සීමාවට නැවත අනුකූලව ක්‍රියා කිරීම සඳහා වන අතිරික්ත වියදම් සහ මුදල් අමාත්‍යවරයා විසින් ගනු ලැබීමට නියමිත ක්‍රියාමාර්ග සහ එම නැවත අනුකූලවීමට ගතවන කාලසීමාව ඇතුලුව, (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති අවස්ථා කළමනාකරණය කිරීම සඳහා වන තොරතුරු සහ යොදා ගැනීමට නියමිත ඉලක්කගත ක්‍රියාමාර්ගවලින් සමන්විත විය යුතු ප්‍රතිසාධන සැලැස්මක් ;

(ඇ) 26 වන වගන්තියට අනුකූල පරිපූරක ඇස්තමේන්තු යෝජනාවක්; සහ

(ඈ) යාවත්කාලීන කරන ලද මධ්‍ය කාලීන මූල්‍ය රාමුවක්.

(5) (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ලේඛන මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය.

ඇපකර සීමාව

**17.** (1) (මෙහි මින්මතු "ඇපකර සීමාව" යනුවෙන් සඳහන් කරනු ලබන) එක් එක් මුදල් වර්ෂය අවසානයේ දී හිග ඇති ආණ්ඩුවේ ඇපකරවල මුළු එකතුව අදාළ මුදල් වර්ෂයේ සහ ඊට පෙරාතුව වූ මුදල් වර්ෂ දෙකේ දළ දේශීය නිෂ්පාදිතයේ සාමාන්‍ය අගයෙන් සියයට 7.5% ක් නොඉක්මවිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකභාවයට එළඹීමෙන් පසුව සෑම වසර පහකට වරක් ම (1) වන උපවගන්තියේ සඳහන් ඇපකර සීමාව සමාලෝචනය කරනු ලැබිය යුතු අතර, මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ නිශ්චිතව දක්වා ඇති ණය අඩුකිරීමේ අරමුණ සමග අනුකූලවීම සහතික කිරීම සඳහා ඇපකර සීමාව යාවත්කාලීන කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇපකර සීමාවෙන් බැහැරවීමක දී මුදල් අමාත්‍යවරයා විසින් අවම වශයෙන් පහත දැක්වෙන කරුණු නිශ්චිතව දක්වමින් වාර්තාවක් පාර්ලිමේන්තුව

වෙත ඉදිරිපත් කළ යුතු අතර, එය මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය:-

(අ) එකී බැහැර වීමට හේතුව; සහ

(ආ) ඉදිරියේ දී ඇපකර සීමාවට අනුකූලව ක්‍රියා කරන බවට සහතිකවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග.

## IV වන කොටස

### වාර්ෂික අයවැය සකස් කිරීම සහ අනුමත කිරීම

වාර්ෂික අයවැයේ විෂය පථය

**18.** (1) වැය ශීර්ෂ අංකයක් වෙන්කරදී ඇති රාජ්‍ය අස්ථිත්වයන්හි වියදම් ඇස්තමේන්තු වාර්ෂික අයවැයට ඇතුළත් කර තිබිය යුතු ය.

(2) වාර්ෂික අයවැය -

(අ) වැය ශීර්ෂ පදනමින් විසර්ජන ආකාරයෙන් ඉදිරිපත් කළ යුතු ය; සහ

(ආ) ජාත්‍යන්තර වශයෙන් පිළිගත් පරිචයන්ට අනුකූලව වර්ගීකරණය කළ යුතු ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150, 151 සහ 152 ව්‍යවස්ථාවලට යටත්ව රජයේ ඒකාබද්ධ අරමුදලින් කරනු ලබන වියදම් විසර්ජන පනතේ අදහස් කර තිබිය යුතු ය.

මූල්‍ය වගකීම්නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම

**19.** (1) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන විසර්ජන පනත සහ කෙටුම්පත් කරන ලද වාර්ෂික අයවැය ඇස්තමේන්තු මේ පනතේ විධිවිධානවලට අනුකූලව සම්පාදනය කරන ලද මධ්‍ය කාලීන මූල්‍ය රාමුවට සහ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයට අනුකූල විය යුතු ය.

(2) කෙටුම්පත් කරන ලද වාර්ෂික අයවැය ඇස්තමේන්තු නියම කරනු ලබන ආකාරයට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

වාර්ෂික අයවැය ලේඛනය සහ ඒ සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ලේඛන

**20.** (1) වාර්ෂික අයවැය ලේඛනය පහත දැක්වෙන ලේඛනවලින් සමන්විත විය යුතු ය:-

(අ) නියම කරනු ලැබිය හැකි ආකෘතිවලට අනුව (මේ පනතේ "වාර්ෂික අයවැය ඇස්තමේන්තු" යනුවෙන් සඳහන් කරනු ලබන) ආදායම් සහ වියදම් ඇස්තමේන්තු; සහ

(ආ) වෙනත් ලේඛන අතර වියදම් ඇස්තමේන්තු සහ ණය ගැනීමේ සීමා ඇතුළත් විසර්ජන පනත් කෙටුම්පත.

(2) වාර්ෂික අයවැය ලේඛනය සමග පහත දැක්වෙන ලේඛන ඉදිරිපත් කරනු ලැබිය යුතු ය:-

(අ) වාර්ෂික අයවැය ලේඛනයේ අන්තර්ගත කරුණු සහ ආණ්ඩුවේ මූල්‍ය ප්‍රතිපත්තියෙන් ඇතිනරනු ලබන සමස්ථ බලපෑම සංක්ෂිප්ත ලෙස දක්වන අයවැය කථාව;

(ආ) පහසුවෙන් තේරුම්ගත හැකි වන පරිදි වාර්ෂික අයවැයේ ප්‍රධාන කරුණු සාරාංසගත කරන ලද ජනතා හිතවාදී අනුවාදයක්;

(ඇ) මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය සහ අයවැය, ආර්ථික සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවක්;

(ඈ) මධ්‍ය කාලීන ණය කළමනාකරණ ක්‍රමෝපාය සහ වාර්ෂික ණය ලබාගැනීමේ සැලැස්ම;

(ඉ) 45 වන වගන්තියේ (1) වන උපවගන්තියට අනුකූලව රාජ්‍ය පෞද්ගලික හවුල්ව්‍යාපාර ව්‍යාපෘති ඇතුළුව දැනට ක්‍රියාත්මකව පවතින සහ අලුතින් අනුමත කරන ලද රාජ්‍ය ආයෝජන ව්‍යාපෘතිවල ලැයිස්තුවක්;

(ඊ) රාජ්‍ය පෞද්ගලික හවුල්ව්‍යාපාර ව්‍යාපෘතිවලට අදාළ බැරකම් ඇතුළුව ආණ්ඩුව විසින් ලබාදී ඇති ණයවල හිඟණය ලැයිස්තුවක් සහ රජයේ ඇපකර ලැයිස්තුවක් සහ අසම්භාවය බැරකම්වල ලැයිස්තුවක්;

(උ) අයවැය අස්ථිත්වයන්හි රජයේ සේවා නියුක්තිකයන්ට අදාළ සංක්ෂිප්ත ලේඛනයක්;

(ඌ) බදු සහන ලබාදීම හේතුවෙන් මේ දක්වා අහිමි වූ ආදායම සහ නව සහන ලබාදීම හේතුවෙන් අහිමි වියහැකි ආදායම ඇතුළුව මුළු ආදායම් අහිමිවීම පිළිබඳ ප්‍රකාශයක්; සහ

(එ) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ නියමකර ඇති හෝ මුදල් අමාත්‍යවරයා විසින් අවශ්‍ය යයි සළකනු ලබන වෙනත් යම් ලේඛන, හෝ තොරතුරු.

වාර්ෂික අයවැය ක්‍රියාවලිය

**21.** (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද එය නොතකා, වාර්ෂික අයවැය අදාළ වන වර්ෂයට පෙරාතුව වූ මුදල් වර්ෂයේ අයවැය කැඳවීමේ චක්‍රලේඛනයට අනුව ජූලි මස තිස්එක් වන දිනට පෙරාතුව සෑම රාජ්‍ය අස්ථිත්වයක් විසින් අයවැය කැඳවීම් චක්‍රලේඛනයට අනුව ම අයවැය ඇස්තමේන්තු පිළියෙල කොට ඉදිරිපත් කළ යුතු ය.

(2) අයවැය කැඳවීම් චක්‍රලේඛයේ -

(අ) 12 වන වගන්තිය යටතේ නියම කර ඇති මධ්‍ය කාලීන මූල්‍ය රාමුවේ නිශ්චිතව දක්වා ඇති මුදල් වර්ෂයට අදාළ ප්‍රාථමික වියදම් සීමාවට අනුකූලව වියදම් සීමා ඇතුළත් විය යුතු ය;

(ආ) විස්තරාත්මක ප්‍රතිපත්ති මාර්ගෝපදේශ හා රාජ්‍ය අස්ථිත්ව විසින් වාර්ෂික අයවැය ක්‍රියාවලිය තුළ අනුකූලව ක්‍රියාකල යුතු ප්‍රධාන කාර්යයන් සහ ඉදිරිපත් කළ යුතු තොරතුරු සහ මෙම වගන්තිය අනුව එම කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා වන කාල රාමුවක් සහිත ලේඛණයක් ඇතුළත් විය යුතු ය;

(ඇ) මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද රාජ්‍ය ආයෝජන වැඩ සටහන ඇතුළත් විය යුතු ය; සහ

(ඈ) භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් අවශ්‍ය යයි සළකනු ලබන වෙනත් උපදෙස් හා විස්තර ඇතුළත් කර තිබිය යුතු ය.

(3) වාර්ෂික අයවැය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙරාතුව වාර්ෂික අයවැය ලේඛන කෙටුම්පතට මුදල් අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබාගත යුතු ය.

(4) වාර්ෂික අයවැය අදාළ වන වර්ෂයට පෙරාතුව වූ වර්ෂයේ ඔක්තෝබර් මස පහළොස්වන දිනට පෙරාතුව මුදල් අමාත්‍යවරයා

විසින් ඉදිරි මුදල් වර්ෂය සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

(5) වාර්ෂික අයවැය සකස් කරනු ලබන වර්ෂයේ නොවැම්බර් මස පහළොස්වන දින හෝ එදිනට පෙරාතුව මුදල් අමාත්‍යවරයා විසින් මේ පනතේ 20 වන වගන්තියේ (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ලේඛන ද සමග මේ පනතේ 20 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද යටතේ වාර්ෂික අයවැය ලේඛනය පාර්මේන්තුවට ඉදිරිපත් කළ යුතු අතර, එදිනම වාර්ෂික අයවැය කෙටුම්පත් ලේඛනය සහ ඒ සමග ඉදිරිපත් කරනු ලබන වෙනත් ලේඛන මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය.

(6) පාර්ලිමේන්තු මහලේකම්වරයා විමසා අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ඇතිව භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් ඉදිරි වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට සහ අනුමත කිරීමට අදාළ අයවැය ක්‍රියාවලිය නිශ්චිත දිනයන් සමග ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

වාර්ෂික අයවැය ක්‍රියාවලිය තුළදී මුදල් අමාත්‍යවරයාගේ සහ භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ වගකීම්

**22.** (1) මුදල් අමාත්‍යවරයා -

(අ) වාර්ෂික අයවැය ක්‍රියාවලිය ක්‍රියාත්මක වන බවට සහතිකවීම සඳහා;

(ආ) විසර්ජන පනත් කෙටුම්පත සහ වාර්ෂික අයවැය ඇස්තමේන්තු කෙටුම්පත් පිළියෙල කරන බවට සහතිකවීම සඳහා; සහ

(ඇ) මධ්‍ය කාලීන මූල්‍ය රාමුවට සහ අයවැය සැලැස්මට අනුකූලව වාර්ෂික අයවැය පිළියෙල කරන බවට සහතිකවීම සඳහා,

වගකිව යුතු ය.

(2) වාර්ෂික අයවැය අදාළ වන වර්ෂයට පෙරාතුව වූ මුදල් වර්ෂයේ ජුනි මස තිස් වන දිනට පෙර අයවැය කැඳවීම් චක්‍රලේඛය නිකුත් කිරීම සඳහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා වගකිව යුතු ය.

අතුරු සම්මත ගිණුම

**23.** (1) පවත්නා වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනය වන විට ඉදිරි වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු නොලැබුවහොත් මුදල් අමාත්‍යවරයා විසින්, පාර්ලිමේන්තුව විසින් දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති සඳහා සහ නිශ්චිත රාජ්‍ය සේවා පවත්වාගෙන යාම සඳහා මුදල් වෙන් කළ යුතු අතුරු සම්මත ගිණුමක් පාර්මේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) අතුරු සම්මත ගිණුම යටතේ වියදම් වෙන් කරනු ලබන කාල සීමාව මාස හතරකට වඩා වැඩි නොවිය යුතු අතර, අතුරු සම්මත ගිණුම යටතේ වියදම් කරන ලද මුදල් ද ඇතුළත්ව විසර්ජන පනත සම්මත කරගත යුතු ය.

## V වන කොටස

### වර්ෂය තුළ වාර්ෂික අයවැයට කරනු ලබන ගැලපීම්

වීරමොං ක්‍රියාපටිපාටිය

**24.** (1) මේ වගන්තියේ (2) වන, (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත් ව (මෙහි මින්මතු "වීරමොං ක්‍රියාපටිපාටිය" යනුවෙන් සඳහන් කරනු ලබන) විසර්ජන පනතක වැය ශීර්ෂයක් ඇතුළත වෙන් කළ මුදලක් මාරු කිරීම, එම විසර්ජන පනතේ විධිවිධාන සමග අනුකූලව සිදු කළ යුතු ය.

(2) වියදම් නොදැරූ ප්‍රතිපාදන ඉතිරිවීම් මාරු කිරීම -

(අ) එක් වැය ශීර්ෂයක සිට වෙනත් වැය ශීර්ෂයකට; හෝ

(ආ) ප්‍රාග්ධන වියදමක සිට පුනරාවර්ථන වියදමකට,

මාරුකිරීමට ඉඩ දෙනු නොලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති සීමාකිරීම්වලට අමතරව, වීරමොං ක්‍රියාපටිපාටිය භාවිත කිරීම පිළිබඳ සීමාකිරීම් නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(4) වීරමොං ක්‍රියාපටිපාටිය භාවිත කර වෙන්කර ඇති මුදලක් මාරුකිරීමක් සිදු වේ නම් එහි බලපෑමට ලක්වන සෑම අයවැය අස්ථිත්වයක්ම එම මාරුකිරීමේ දින සිට මාස හයක් ඇතුළත මුදල් අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුව වෙත වාර්තා කළ යුතු ය. එවැනි වාර්තා කිරීමක ක්‍රියා පටිපාටිය නියම කරනු ලබන පරිදි විය යුතු ය.

**වාර්ෂික අයවැය සංචිතය**

**25.** (1) නිශ්චිතව හඳුනා නොගත් වියදම් සඳහා වූ ප්‍රතිපාදනයන් විසර්ජන පනතට ඇතුළත් කළ හැකි අතර, එකී වෙන්කිරීම් අදාළ මුදල් වර්ෂය සඳහා වූ වාර්ෂික අයවැය සංචිත ලෙස හඳුන්වනු ලැබිය යුතු ය.

(2) වාර්ෂික අයවැය සංචිතය සඳහා වෙන් කරන ලද මුදල යෝජිත ප්‍රාථමික වියදම්වල සීමාවෙන් සියයට දෙකක් නොඉක්මවිය යුතු ය.

(3) දැනට පවත්නා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී, වාර්ෂික අයවැය සංචිතයේ ඇති ප්‍රතිපාදන, ලිඛිත නීතියේ අර්ථ නිරූපනය කර ඇති පරිදි වූ හදිසි සහ අනපේක්ෂිත අවශ්‍යතා සඳහා වන වියදම් ආවරණය කිරීම සඳහා වෙන් කරනු ලැබිය හැකි ය.

(4) වාර්ෂික අයවැය සංචිතයෙන් ලබා ගන්නා මුදල් වෙන් කිරීමක් විසර්ජන පනතේ විධිවිධානවලට අනුකූලව අනුමත කළ යුතු අතර, එය මාස දෙකක් ඇතුළත පාර්ලිමේන්තුව වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

**පරිපූරක ඇස්තමේන්තු**

**26.** (1) පරිපූරක ඇස්තමේන්තු යෝජනාවක් පහත දක්වෙන අවස්ථානුගත කරුණුවල දී නියම කරනු ලැබිය හැකි ආකාරයට අනුමතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය:-

(අ) අමාත්‍ය මණ්ඩලයේ මතය අනුව ප්‍රධාන ආර්ථික අර්බුදකාරී අවස්ථාවක දී බරපතල බාහිර බලපෑම්, ස්වභාවික විපත්, ප්‍රධාන අසම්භාව්‍ය බැරකම් පැනනැගීම හෝ එවැනි වෙනත් යම් අවස්ථානුගත කරුණු වැනි අනපේක්ෂිත අවස්ථාවල දී;

(ආ) වර්ෂය තුළ දී පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද විසර්ජන පනතේ වැය ශීර්ෂයක් මගින් ආවරණය නොවූ අතිරේක වියදමක් දැරීමට අයවැය අස්ථිත්වයකට අවශ්‍ය වුවහොත්; සහ

(ඇ) අදාළ වියදම් -

(i) 24 වන වගන්තියේ විධිවිධාන සළසා ඇති පරිදි වීරමොං ක්‍රියාපටිපාටිය හරහා ලබාදීමට හැකියාවක් නොමැත්තේ නම්;

(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 151 වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවනු ලැබ ඇති අවිනිශ්චිත අවස්ථා අරමුදල හරහා වියදම් ලබාදීමට හැකියාවක් නොමැත්තේ නම්; හෝ

(iii) 25 වන වගන්තියේ විධිවිධාන සළසා ඇති පරිදි වාර්ෂික අයවැය සංචිතයෙන් මුදල් වෙන් කරවා ගැනීමට හැකියාවක් නොමැත්තේ නම්.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ පරිපූරක ඇස්තමේන්තු යෝජනාවකට පහත දැක්වෙන කරුණු ඇතුළත් විය යුතු ය:-

(අ) මෑතක දී සිදු වූ සාර්ව ආර්ථික සංවර්ධන කටයුතු සහ මූල්‍ය සංවර්ධන කටයුතුවල සමාලෝචනයක්;

(ආ) වාර්ෂික අයවැයේ යාවත්කාලීන කරන ලද ආදායම් සහ වියදම් පිළිබඳ පුරෝකථන;

(ඇ) එක් එක් වැය ශීර්ෂ සඳහා විසර්ජනය කළ ප්‍රතිපාදන වලට කරන ලද වෙනස් කිරීම් පිළිබඳ පැහැදිලි කිරීමක්; සහ

(ඈ) අතිරේක මූල්‍යයන මූලාශ්‍ර සහ නියම කරනු ලැබිය හැකි වෙනත් යම් තොරතුරු.

(3) (1) වන උපවගන්තිය යටතේ අතිරේක වියදම් සඳහා වූ ඉල්ලීම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙරාතුව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

වියදම් අතිරික්ත

**27.** (1) යම් මුදල් වර්ෂයක් සඳහා ආණ්ඩුවේ ගිණුම් වසා ඇති අවස්ථාවක -

(අ) අදාළ මුදල් වර්ෂය සඳහා විසර්ජන පනත මගින් හෝ අවිනිශ්චිත අවස්ථා අරමුදලින් හෝ පරිපූරක ඇස්තමේන්තුවෙන් වෙන් කරන ලද මුදලට වඩා වැඩියෙන් වියදම් කර ඇති බව; හෝ

(ආ) අයවැය මුදල් වෙන් කිරීම් ලබා දී නොමැති කාර්යයක් සඳහා වියදම්කර ඇති බව,

සොයා ගනු ලැබුවේ නම්, එම අතිරික්ත මුදල අධිකාරී බලය නොලත් අතිරික්ත වියදමක් ලෙස සළකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති අවස්ථාවල දී අදාළ අයවැය අස්ථිත්වයක් විසින් නියම කරනු ලැබිය හැකි තොරතුරු ඇතුළත් විය යුතු වාර්ෂික මූල්‍ය ප්‍රකාශයට අමුණා ඇති අතිරික්ත වියදම පිළිබඳ ප්‍රකාශයක් මුදල් වර්ෂය අවසන් වී දින අනූවක් ගතවීමට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

(3) අධිකාර බලය නොලත් අතිරික්ත වියදමක් දැරීම වගකිවයුතු නිලධාරින්ට එරෙහිව විනයානුකූල ක්‍රියා මාර්ගයක් ගැනීම සඳහා අතිරික්ත වියදමක් දැරීම පදනමක් විය යුතු ය.

## VI වන කොටස

## අයවැය ක්‍රියාත්මක කිරීම

වොරන්ට් බලපත්‍ර

**28.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 වන ව්‍යවස්ථාව යටතේ මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද වොරන්ට් බලපත්‍රයක අධිකාරී බලයක් නොමැතිව අයවැය අස්ථිත්වයක් විසින් අසම්භාව්‍ය බැරකම් ඇතුළුව යම් මූල්‍ය වගකීමක් හෝ බැරකමක් නොදැරිය යුතු ය.

(2) අදාළ වියදම්, වොරන්ට් බලපත්‍රයේ සඳහන් අධිකාරී බලයට අනුකූල විය යුතු වන බවට සහතිකවීම සඳහා රාජ්‍ය අස්ථිත්වයේ ප්‍රධාන ගණන්දීමේ නිලධරයා හෝ ගණන්දීමේ නිලධරයා වගකිව යුතු ය. අධිකාරී බලයට අනුකූල නොවන යම් වියදමක් සඳහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා අවසර නොදිය යුතු අතර ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් එම මුදල අයකරගනු ලැබිය හැකි ය.

(3) වොරන්ට් බලපත්‍ර මගින් ලබා දී ඇති අධිකාරී බලය අදාළ මුදල් වර්ෂය අවසන්වීමේ දී බල රහිත විය යුතු ය.

වියදම් පාලන පද්ධතිය

**29.** (1) රජයේ අරමුදල්වල යම් වියදමක් පහත දැක්වෙන පියවරයන්ට යටත්ව සිදු කරනු ලැබිය යුතු ය:-

(අ) නිසි බලධරයාගෙන් අධිකාරය පෙරාතුව ලබාගත යුතු ය;

(ආ) නිසි බලධරයාගෙන් අනුමතය පෙරාතුව ලබාගත යුතු ය;

(ඇ) නිසි බලධරයා විසින් වගකීමට බැඳිය යුතු ය;

(ඇ) නිසි බලධරයා විසින් සහතික කිරීම කළ යුතු ය; සහ

(ඉ) අදාළ රාජ්‍ය අස්ථිත්වය විසින් ගෙවීම් කිරීම කළ යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා නිසි බලධරයා යන්නෙන්, අදාළ රාජ්‍ය අස්ථිත්වයේ ගණන්දීමේ නිලධරයා විසින් අධිකාරි බලය ලබාදීම, අනුමතිය ලබාදීම, වගකීමට බැඳීම, සහතික කිරීම හෝ ගෙවීම් කිරීම යන කාර්යයන් පවරනු ලැබ ඇති යම් නිලධරයකු අදහස් වේ.

(3) ගණන්දීමේ නිලධාරීන් විසින් පොදු හෝ එක් එක් ගණුදෙනු සම්බන්ධයෙන් බලය පැවරිමක් සිදු කළ හැකි අතර බලය පවරා ඇති නිලධාරීන්ගේ ප්‍රවීණතාවය පිළිබඳව සහ බලය පැවරීමේ පද්ධතියෙහි, අභ්‍යන්තර පරීක්ෂාවන්ගේ ප්‍රමාණවත් බව පිලිබඳව වගකිව යුතු ය.

(4) වගකීම්වලට බැඳීම සඳහා අනුමතය, එම වගකීම් දැරීම සඳහා වාර්ෂික අයවැය මගින් නිර්බාධක සහ ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර තිබිය යුතු ය. යන්නට යටත් විය යුතු ය.

(5) තුන්වන පාර්ශ්වයක් වෙතින් නිසි බලධරයා වෙත වැඩ, භාණ්ඩ හා සේවා ලද පසු ඒ සඳහා ගෙවීම් කිරීමේ වගකීමට බැඳේ.

(6) අයවැය අස්ථිත්වක් විසින් එළඹෙන ලද හෝ ඇතිකර ගන්නා ලද වියදම් දැරීම සඳහා බැඳීමක් ඇතිවිය හැකි ගිවිසුමක් හෝ වෙනත් ආකාරයක වැඩ පිළිවෙළක් නියම කරනු ලැබිය හැකි ආකාරයකට, මූල්‍ය කළමනාකරණ තොරතුරු පද්ධතියට ඇතුළත් කළ යුතු ය.

(7) මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී හිඟ තබා ඇති වියදම් බැඳීම අඩුකිරීම සඳහා මුදල් අමාත්‍යවරයා විසින් ගෙවා නිදහස් කිරීමේ ක්‍රමෝපායක් හඳුන්වාදීම කළ යුතු අතර, හිඟ මුදල් එකතුවීම වැළැක්වීම සඳහා යන්ත්‍රණය පුළුල් කළ යුතු ය.

වාර්ෂික අයවැය අවසන්වීම සහ අවලංගු වූ ගෙවීම්

**30.** (1) වාර්ෂික අයවැය යටතේ විසර්ජනය කරන ලද මුදල් වියදම් කිරීමට ඇති අධිකාරී බලය එම අයවැය අදාළ වන මුදල් වර්ෂය අවසානයේ දී අවසන් විය යුතු අතර, බලාත්මකභාවයක් නොතිබිය යුතු ය.

(2) යම් හිමිකම්පෑමක් සඳහා මුදල් ගෙවීම එම හිමිකම්පෑම උපචිත වූ මුදල් වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනට පෙරාතුව සිදුකිරීමට නොහැකි වූ අවස්ථාවක දී එම හිමිකම්පෑම සඳහා මුදල් ගෙවීම ඊළඟ මුදල් වර්ෂයේ දී අදාළ "වියදම් ක්ෂේත්‍රයට" අනුරූපීව සිදු කල යුතු ය. එසේ මුදල් ගෙවීම සඳහා වූ කාර්ය පටිපාටිය නියම කරනු ලබන පරිදි විය යුතු ය.

බහු වාර්ෂික වියදම් වගකීම

**31.** (1) අදාළ වර්ෂයේ වාර්ෂික අයවැයෙහි යෝජනා කර ඇති බහු වාර්ෂික වියදම් ගෙවීමේ වගකීම් මධ්‍ය කාලීන මූල්‍ය රාමුව සමඟ අනුකූල වන බවට මුදල් අමාත්‍යවරයා සහතික විය යුතු ය.

(2) බහුවාර්ෂික වියදම් සඳහා වගකීම්වලට ඇතුළත්වීමට පෙර අදාළ අයවැය අස්ථිත්වයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබාගත යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා "බහු වාර්ෂික වියදම් සඳහා වගකීමට බැඳීම" යන්නෙන්, අදාළ මුදල් වර්ෂයට පසුව වූ මුදල් වර්ෂවල විසර්ජන පනත්වලින් වියදම් වගකීම් පියවීම සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදාන අදහස් වන අතර, ඊට රාජ්‍ය ආයෝජන ව්‍යාපාර, අදාළ පුවරාවර්තන වියදම් රාජ්‍ය පෞද්ගලික හවුල්ව්‍යාපාර ව්‍යාපෘති යටතේ රජයේ වගකීම් සහ වෙනත් ආයෝජන සහ මූල්‍යයන ඇතුළත් වේ.

ප්‍රසම්පාදනය

**32.** (1) ලිඛිත නීතීන්හි සහ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් කලින් කල නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්හි නිශ්චිතව දක්වා ඇති ප්‍රසම්පාදන කාර්ය පටිපාටි අනුගමනය කරමින් සෑම රාජ්‍ය අස්ථිත්වයක් විසින් ම භාණ්ඩ, සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය කළ යුතු ය.

(2) (අ) 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ (i) වන අනුඡේදයේ නිශ්චිතව දක්වා ඇති සෑම රාජ්‍ය අස්ථිත්වයක් විසින් ම තම වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම් සකස් කර ඒවා භාණ්ඩාගාරයේ ලේකම්වරයාට ඉදිරිපත් කළ යුතු ය.

(ආ) 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ (ii) වන සහ (iii) වන අනුඡේදවල නිශ්චිතව දක්වා ඇති සෑම රාජ්‍ය

අස්ථිත්වයක් විසින් ම තම වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම් සකස් කර ඒවා අදාළ ප්‍රධාන ගණන්දීමේ නිලධරයාට ඉදිරිපත් කළ යුතු ය.

(3) මුදල් අමාත්‍යවරයා විසින් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විමසා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමෙන් නිදහස් කළ යුතු රජයට අයත් ව්‍යවසායන් කවරේද යන්න නියම කරනු ලැබිය හැකි ය.

(4) පළාත් සභා විසින් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ අනුමතිය ඇතිව භාණ්ඩ, සේවා, වැඩ, උපදේශක සේවා, සහ තොරතුරු පද්ධති සම්බන්ධයෙන් පළාත් සභා විසින් ඔවුන්ගේ ම මාර්ගෝපදේශ අනුගමනය කරනු ලැබිය හැකි ය.

**අභ්‍යන්තර විගණනය**

**33.** (1) අභ්‍යන්තර විගණකවරයකු පත් කරනු ලැබ ඇත්තේ යම් රාජ්‍ය අස්ථිත්වයකට ද, එම රාජ්‍ය අස්ථිත්වයේ සෑම ප්‍රධාන ගණන්දීමේ නිලධරයකු හෝ ගණන්දීමේ නිලධරයෙකු හෝ පාලක මණ්ඩලය විසින් අභ්‍යන්තර විගණකවරයා තම කර්තව්‍ය ස්වාධීනව ඉටුකරන බවටත් සබඳතා අතර ගැටුමක් ඇති විය හැකි ආකාරයේ කර්තව්‍ය අභ්‍යන්තර විගණකවරයාට නොපවරන බවටත් සහතික විය යුතු ය.

(2) (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද විධාන අභ්‍යන්තර විගණකවරයා විසින් අනුගමනය කළ යුතු අතර, අදාළ වැය ශීර්ෂය පිළිබඳ අභ්‍යන්තර විගණකවරයාගේ තීරණය සඳහන් කරමින් රාජ්‍ය අස්ථිත්වයේ ප්‍රධාන ගණන්දීමේ නිලධරයාට හෝ ගණන්දීමේ නිලධරයාට හෝ පාලක මණ්ඩලයට වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වන සහ 41 වන වගන්තිවල විධිවිධාන ප්‍රකාරව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට එම වාර්තාවේ පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(3) අභ්‍යන්තර පාලනය, අභ්‍යන්තර විගණන සහ රාජ්‍ය අස්ථිත්වවල විගණන සහ කළමනාකරණ කමිටු ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් විධාන නිකුත් කළ යුතු ය.

## VII වන කොටස

### මූල්‍ය කළමනාකරණය

**භාණ්ඩාගාර මුදල් ගලන කළමනාකරණය හා භාණ්ඩාගාර කේවල ගිණුම් පද්ධතිය**

**34.** (1) (අ) භාණ්ඩාගාරයේ ලේකම්වරයා සභාපතිධුරය දරන්නා වූ ද භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරුන්ගෙන් සහ භාණ්ඩාගාරයේ දෙපාර්තමේන්තුන්හි ප්‍රධානීන්ගෙන් ද පහත දැක්වෙන ආදයම් දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්ගෙන් ද සමන්විත මුදල් ප්‍රවාහ කළමනාකරණය පිළිබඳ කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු ය:-

(i) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ii) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා; සහ

(iii) සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා,

(ආ) ඉහත (අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති කමිටුවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය, වගකීම් සහ ක්‍රියාකාරීත්වය නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(2) 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ (i) වන හා (ii) වන අනු ඡේදවල සඳහන් රාජ්‍ය අස්ථිත්වයන්ට ලැබෙන මුදල් ඇතුළුව ආණ්ඩුවේ සියලුම මුදල් තැන්පත් කළ යුතු සහ වියදම් ඒකාබද්ධ ආකාරයට කළමනාකරණය කිරීමට ඉඩ සැලසෙන රාජ්‍ය අස්ථිත්වයන්හි ඒකාබද්ධ බැංකු ගිණුම් පද්ධතියකින් සමන්විත භාණ්ඩාගාරයේ කේවල ගිණුමක් තිබිය යුතු ය.

**රාජ්‍ය මූල්‍ය වෙන්කර දීම සඳහා බැංකු ගිණුම් විවෘත කිරීම සහ වසා දැමීම**

**35.** (1) ආණ්ඩුවේ මුදල් සහ ද්‍රවශීල අවශ්‍යතා කළමනාකරණය කිරීමේ කාර්ය සඳහා නිල බැංකු ගිණුම් විවෘත කිරීමට, පවත්වාගෙන යාමට සහ වසා දැමීමට අවසර දීම සඳහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාට හෝ භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් ඒ වෙනුවෙන් බලය පවරන ලද නිලධරයෙකුට බලය ඇත්තේ ය.

(2) භාණ්ඩාගාර කේවල ගිණුමට යටත් නොවන රාජ්‍ය අස්ථිත්වයකට එම රාජ්‍ය අස්ථිත්වය පිහිටුවනු ලැබූ අදාළ ලිඛිත නීතිය ප්‍රකාරව රාජ්‍ය මුදල් වෙන්කර දීමේ කාර්ය සඳහා බැංකු ගිණුම් විවෘත කිරීමට, පවත්වාගෙන යාමට හා වසා දැමීමට එම රාජ්‍ය අස්ථිත්වයේ පාලක මණ්ඩලයට බලය තිබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් නිල බැංකු ගිණුම් විවෘත කිරීම සහ වසා දැමීම පිළිබඳ විස්තර නියම කරනු ලබන පරිදි විය යුතු ය.

**තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම**

**36.** (1) මේ පනතේ නිශ්චිතව දක්වා ඇති කර්තව්‍ය සහ මහා භාණ්ඩාගරයේ කර්තව්‍ය කරගෙනයෑම සඳහා සංවර්ධනය කරන ලද සඵලදායි පරිගණක පද්ධතියක් තිබිය යුතු ය.

(2) රාජ්‍ය අස්ථිත්වයේ පරිගණක මූල්‍ය කළමනාකරණ සහ වෙනත් තොරතුරු පද්ධතිවල ක්‍රියාකාරීත්වය, සුරක්ෂිතභාවය, ආරක්ෂාව සහ නිරවද්‍යභාවය නියම කර ඇති පරිදි සමාලෝචනය කර ඇගයීමට ලක් කරනු ලැබිය යුතු ය.

ආණ්ඩුව වෙත කරණු ලබන විදේශීය ප්‍රදාන සහ දේශීය ප්‍රදාන

**37.** (1) ගිවිසුම් අත්සන් කර ප්‍රදාන ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩලය විසින් රාජ්‍ය අස්ථිත්වයකට ලිඛිතව බලය පවරනු ලැබ ඇති අවස්ථාවල දී හැර අමාත්‍ය මණ්ඩලයේ අවසරයට යටත්ව විදේශීය රාජ්‍ය හෝ ජාත්‍යන්තර සංවිධාන සමග විදේශීය ප්‍රදාන සම්බන්ධයෙන් සියලු ගිවිසුම් අත්සන් කිරීමට හෝ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විදේශීය දායකයන්ගෙන් හෝ දේශීය දායකයන්ගෙන් ප්‍රදාන ලබාගැනීමට භාණ්ඩාගාරයේ ලේකම්වරයාට බලය ඇත්තේ ය.

(2) (මේ වගන්තියේ විදේශීය ප්‍රදාන යනුවෙන් සඳහන් කරනු ලබන) විදේශීය රජයකින්, ජාත්‍යන්තර සංවිධානයකින් හෝ වෙනත් විදේශීය දායකයකුගෙන් ලැබෙන ප්‍රදාන, හෝ දේශීය දායකයකුගෙන් ලැබෙන ප්‍රදාන-

(අ) ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය; සහ

(ආ) ප්‍රදානය ක්‍රියාවේ යෙදවීම සඳහා වගකිව යුතු රාජ්‍ය අස්ථිත්වයේ වාර්ෂික අයවැය කෙටුම්පතට ඇතුළත් කළ යුතු ය.

(3) මේ වගන්තිය යටතේ ද්‍රව්‍යමය වශයෙන් ප්‍රදාන ලබාගන්නා රාජ්‍ය අස්ථිත්වයක් විසින් අදාළ ලිඛිත නීතියට අනුකූලව එම ප්‍රදානයේ මුදල් වටිනාකම තීරණය කර වාර්තාගත කළ යුතු ය.

(4) අවස්ථාවෝචිත පරිදි, විදේශීය ප්‍රදාන හෝ දේශීය ප්‍රදාන ලබාගැනීම සඳහා වන නියමයන් හා කාර්ය පටිපාටිය නියම කරනු ලබන පරිදි විය යුතු ය.

වත්කම් කළමනාකරණය කිරීම

**38.** (1) 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ (i) වන, (ii) වන සහ (iii) වන අනුඡේදවල සඳහන් කරනු ලැබ ඇති රාජ්‍ය අස්ථිත්වයක මූල්‍ය නොවන වත්කම් හඳුනාගැනීම, වර්ගීකරණය කිරීම, ඇගයීම, උපයෝජනය කිරීම, සහ බැහැර කිරීම ඇතුළුව ඒවායේ කළමනාකරණය, යම් අදාළ ලිඛිත නීතියකට යටත්ව පාලනය කරනු ලැබිය යුතු ය.

(2) යම් චංචල හෝ නිශ්චල දේපළක් හෝ අයවැය අස්ථිත්වයකට අයත් අනන්‍ය වූ වරප්‍රසාදයක් විකිණීම මගින් ලැබෙන මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු අතර, නියම කරනු ලැබිය හැකි ආකාරයෙන් කටයුතු කළ යුතු ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා-

(අ) "බැහැර කිරීම" යන්නට, ආයෝජන කාර්යය සඳහා හෝ වෙනත් යම් වාණිජමය කාර්යයක් සඳහා වත්කම් බැහැර කිරීම ඇතුළත් නොවිය යුතු ය; සහ

(ආ) "චංචල දේපළ" යන්නට, මුදල් ඇතුළත් නොවිය යුතු ය.

## VIII වන කොටස

## ව්‍යවස්ථාපිත අරමුදල්

*ව්‍යවස්ථාපිත අරමුදල් සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ ලේකම්වරයා සතු බලතල*

**39.** (1) භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් සියලු ව්‍යවස්ථාපිත අරමුදල් අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම, සහ නිරීක්ෂණය කිරීම කළ යුතු අතර ව්‍යවස්ථාපිත අරමුදල් පිළිබඳ විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) ව්‍යවස්ථාපිත අරමුදල්වල කාර්යසාධනය පිළිබඳ වාර්තාවක් භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් අවම වශයෙන් වසරකට එක්වරක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) සෑම ව්‍යවස්ථාපිත අරමුදලක් ම -

(අ) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් නිකුත් කරන ලද යම් විධානයකට අනුකූලව ක්‍රියා කළ යුතු ය;

(ආ) (i) ව්‍යවස්ථාපිත අරමුදලේ ප්‍රධාන ගණන්දීමේ නිලධරයා සහ අදාළ අමාත්‍යවරයා විසින් පිටසන් කරන ලද වාර්ෂික අයවැය ඇස්තමේන්තු කෙටුම්පත භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය;

(ii) යම් ව්‍යවස්ථාපිත අරමුදලකට වාර්ෂික අයවැයෙන් අරමුදල් වෙන්කරනු ලබයි නම් භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් නිකුත්කළ අයවැය කැඳවීම්

චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි අයවැය යෝජනා පිළියෙල කළ යුතු ය;

(ඇ) නියම කරනු ලැබිය හැකි පරිදි තම කාර්යසාධනය පිළිබඳ නිත්‍ය වාර්තා භාණ්ඩාගාරයේ ලේකම්වරයාට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය; සහ

(ඈ) භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් ලිඛිතව නියම කරනු ලබන වෙනත් තොරතුරු ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට යම් ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් ඒවායේ ක්‍රියාකාරීත්වය අවසන් කළ යුතු අතර, මේ පනත ක්‍රියාත්මකවීමේ දින සිට එක් වර්ෂයක් ඇතුළත එම අරමුදල් විසුරුවා හරිනු ලැබිය යුතු ය:

එසේ වුව ද, එම අරමුදල දිගටම පවත්වාගෙන යා යුතු බවට භාණ්ඩාගාරයේ ලේකම්වරයා විමසා මුදල් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබුවහොත් නියම කරනු ලබන පරිදි එම අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පරිවර්තනය කරනු ලැබිය හැකි ය.

## IX වන කොටස

### රාජ්‍ය ආයෝජන කළමනාකරණය

රාජ්‍ය ආයෝජන කළමනාකරණය පිළිබඳ පොදු ප්‍රතිපත්ති සහ රාජ්‍ය ආයෝජන කමිටුව

**40.** (1) රාජ්‍ය පෞද්ගලික හවුල්ව්‍යාපාර ව්‍යාපෘතියක් ඇතුළුව රාජ්‍ය ආයෝජන ව්‍යාපෘතියක් තෝරා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම -

(අ) 2 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අරමුණුවලට අනුකූලව සිදු කළ යුතු ය;

(ආ) III වන කොටසෙහි විධිවිධාන සලසා ඇති මූල්‍ය වගකීම් රාමුවට අනුකූලව සිදු කළ යුතු ය; සහ

(ඇ) ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධන ප්‍රතිපත්ති සැලැස්මට, ජාතික ප්‍රතිපත්තිවලට, ආංශික සැලසුම්වලට සහ රාජ්‍ය ආයෝජන වැඩසටහනට අනුකූලව සිදු කළ යුතු ය.

(2) මුදල් අමාත්‍යවරයා විසින් පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත රාජ්‍ය ආයෝජන කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු ය:-

(අ) පහත සඳහන් විෂය ක්ෂේත්‍ර සඳහා වගකිව යුතු මහා භාණ්ඩාගාරයේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්:-

(i) ජාතික ක්‍රම සම්පාදන;

(ii) රාජ්‍ය මුදල්;

(iii) මූල්‍ය ප්‍රතිපත්ති;

(iv) ජාතික අයවැය;

(v) රාජ්‍ය ණය කළමනාකරණය;

(vi) විදේශ සම්පත්;

(vii) භාණ්ඩාගාර මෙහෙයුම්;

(viii) රාජ්‍ය ව්‍යාපාර;

(ix) කළමනාකරණ සේවා;

(x) ව්‍යාපෘති කළමනාකරණය සහ අධීක්ෂණය; සහ

(ආ) රාජ්‍ය පෞද්ගලික හවුල්ව්‍යාපාර විෂය භාර බලධරයා.

(3) රාජ්‍ය ආයෝජන කමිටුවේ සභාපතිවරයා භාණ්ඩාගාරයේ ලේකම්වරයා විය යුතු ය.

(4) රාජ්‍ය ආයෝජන කමිටුවේ ලේකම්වරයා, භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන ජාතික ක්‍රමසම්පාදන විෂයය සඳහා වගකිව යුතු දෙපාර්තමේන්තුවේ නිලධරයකු විය යුතු ය.

(5) රාජ්‍ය ආයෝජන කමිටුව -

(අ) මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යංශය මගින් පළ කරනු ලැබිය යුතු නිර්ණායක මත පදනම්ව 43 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර ව්‍යාපෘති ඇතුළුව රාජ්‍ය ආයෝජන ව්‍යාපෘතිතෝරා ගැනීම;

(ආ) වාර්ෂික අයවැයෙන් මුදල් ලබාදීම ඇතුළුව එවැනි ව්‍යාපෘති සඳහා මුදල් වෙන්කිරීමේ ක්‍රමවේදය පිළිබඳව මුදල් අමාත්‍යවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම; සහ

(ඇ) මේ පනතේ විධිවිධාන සහ ඒ යටතේ රාජ්‍ය පෞද්ගලික හවුල්ව්‍යාපාර ව්‍යාපෘති ඇතුළුව රාජ්‍ය ආයෝජන ව්‍යාපෘතීන්ට අදාළව සාදන ලද නියෝග ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම සහ අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවල දී මුදල් අමාත්‍යවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම, සඳහා වගකිව යුතු ය.

රාජ්‍ය ආයෝජන වැඩසටහන

**41.** (1) ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුව මත පදනම්ව සැලසුම් කර ඇති රාජ්‍ය පෞද්ගලික හවුල්ව්‍යාපාර ව්‍යාපෘති ඇතුළුව දැනට ක්‍රියාත්මක සහ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත රාජ්‍ය ආයෝජන ව්‍යාපෘතිවලින් සමන්විත රාජ්‍ය ආයෝජන වැඩසටහනක් තිබිය යුතු ය. වාර්ෂිකව යාවත්කාලීන කළ යුතු රාජ්‍ය ආයෝජන වැඩසටහන මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජාතික ක්‍රම සම්පාදන විෂය සඳහා වගකිය යුතු දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයට සකස් කර මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කර මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිළ වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය.

(2) යම් වර්ෂයක මැයි මස පහළොස්වන දිනය වන විට රාජ්‍ය පෞද්ගලික හවුල්ව්‍යාපාර ව්‍යාපෘතියක් ඇතුළුව නව රාජ්‍ය ආයෝජන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අදහස් කරන සෑම අයවැය අස්ථිත්වයක් ම නියම කරන ලද විස්තර ඇතුළත් ව්‍යාපෘති යෝජනාව එකී යෝජනාව ක්‍රියාත්මක කිරීමට පෙර වර්ෂයේ මැයි පහළොස්වන දිනය වන විට ජාතික ක්‍රම සම්පාදන විෂයය සඳහා වගකිව යුතු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) ජාතික ක්‍රම සම්පාදන විෂයය සඳහා වගකිව යුතු දෙපාර්තමේන්තුව විසින් -

(අ) නියම කරනු ලැබිය හැකි ඇගයීම් ක්‍රමවේදවලට අනුකූලව අයවැය අස්ථිත්ව විසින් ඉදිරිපත් කරන ලද පූර්ව ශක්‍යතා අධ්‍යයන වාර්තා සහ ශක්‍යතා අධ්‍යයන වාර්තා ඇතුළුව ව්‍යාපෘති ලේඛන සමාලෝචනය කරනු ලැබිය යුතු ය;

(ආ) ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධන සැලැස්ම මධ්‍ය කාලීන මූල්‍ය රාමුව ඇතුළුව මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ අනුකූලතාවය සහ ව්‍යාපෘති ලේඛන ඇගයීම මත පදනම් ව රාජ්‍ය ආයෝජන වැඩසටහනට ඇතුළත් කිරීමට ව්‍යාපෘතිය භාරගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සිදු කළ යුතු ය.

ව්‍යාපෘතිය තෝරා ගැනීම සහ අයවැයකරණය

**42.** (1) 41 වන වගන්තියේ සඳහන් රාජ්‍ය ආයෝජන වැඩසටහනට රාජ්‍ය පෞද්ගලික හවුල්ව්‍යාපාර ව්‍යාපෘතියක් ඇතුළුව රාජ්‍ය ආයෝජන ව්‍යාපෘතියක් ඇතුළත් කර ඇත්නම්, සෑම අයවැය අස්ථිත්වයක් ම එම යෝජිත ව්‍යාපෘති වාර්ෂික අයවැයට ඇතුළත් කිරීම සඳහා මුදල් අමාත්‍යවරයාට යෝජනා කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් රාජ්‍ය පෞද්ගලික හවුල්ව්‍යාපාර ව්‍යාපෘතියක් ඇතුළුව රාජ්‍ය ආයෝජන ව්‍යාපෘතියක් සඳහා වූ යම් යෝජනාවක්, භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් නිකුත් කරනු ලබන අයවැය කැඳවීම් චක්‍රලේඛවල නිශ්චිතව දක්වා ඇති ආකෘති පත්‍රයක් මගින් අයවැය අස්ථිත්වයේ අයවැය යෝජනාවලට ඇතුළත් කළ යුතු ය.

(3) අයවැය කැඳවීම් චක්‍රලේඛවල දක්වා ඇති සීමාවන්ට යටත්ව රාජ්‍ය ආයෝජන කමිටුව විසින් -

(අ) නියම කරනු ලැබිය හැකි ව්‍යාපෘති තෝරා ගැනීමේ නිර්ණායක අනුව රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර ව්‍යාපෘති ඇතුළුව යෝජිත රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති සමාලෝචනය කරනු ලැබිය යුතු අතර, මුදල් අමාත්‍යවරයාගේ අනුමතය සඳහා සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමතය සඳහා වන වාර්ෂික අයවැය කෙටුම්පතට ඇතුළත් කිරීම සඳහා ප්‍රමුඛතා ව්‍යාපෘති ලැයිස්තුවක් සකස් කිරීම සිදු කළ යුතු ය; සහ

(ආ) පවතින මූල්‍ය අවකාශය සහ සළකා බැලිය යුතු වෙනත් අදාළ කරුණු සැළකිල්ලට ගනිමින් ව්‍යාපෘති සඳහා සුදුසු අරමුදල් මූලාශ්‍ර නිර්දේශ කිරීම සිදු කළ යුතු ය.

(4) රාජ්‍ය ආයෝජන වැඩසටහනට ඇතුළත් නොවන රාජ්‍ය පෞද්ගලික හවුල්ව්‍යාපාර ව්‍යාපෘතියක් ඇතුළු රාජ්‍ය ආයෝජන ව්‍යාපෘතියකට වාර්ෂික අයවැය මගින් මුදල් වෙන් කිරීම් නොකරන බවට මුදල් අමාත්‍යවරයා සහතික විය යුතු ය.

(5) (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ස්වභාවික ව්‍යසනයන්ට හෝ ආණ්ඩුව මගින් හදිසි

අවස්ථාවලට ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් විශේෂයෙන් සංවර්ධනය කරන ලද රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති රාජ්‍ය ආයෝජන වැඩසටහනෙන් පිටත සළකා බැලිය හැකි ය. එවැනි රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති, නියම කරනු ලැබිය හැකි නිර්ණායක හා කාර්යපටිපාටීන්ට යටත් විය යුතු ය.

(6) (5) වන උපවගන්තියේ සඳහන් රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති -

(අ) යම් අදාළ ලිඛිත නීතියක විධිවිධානවලට යටත් විය යුතු ය; සහ

(ආ) අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

රාජ්‍ය පෞද්ගලික හවුල්ව්‍යාපාර ව්‍යාපෘති

**43.** (1) මේ පනත යටතේ රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටිය සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර ව්‍යාපෘතීන් ද යටත් විය යුතු ය. රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර ව්‍යාපෘති සඳහා අදාළ වන අතිරේක විධිවිධාන නියම කරනු ලැබිය හැකි පරිදි විය යුතු ය. රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර ව්‍යාපෘතියක්-

(අ) නියම කරන ලද ආර්ථික-සමාජයීය සහ පාරිසරික නිර්ණායක අනුව ආර්ථික ප්‍රතිලාභයක් ලබාදෙන ව්‍යාපෘතියක් බවට, සළකනු ලබන්නේ නම්;

(ආ) රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරවලට ආණ්ඩුව විසින් සපයනු ලබන යම් ඇපකර මධ්‍ය කාලීන මූල්‍ය රාමුව යටතේ වූ සීමාවන් ඉක්මවා නොයන්නේ නම්; සහ

(ඇ) රාජ්‍ය පෞද්ගලික හවුල්ව්‍යාපාරවල දී ආණ්ඩුව දරනු ලබන අවදානම සාධාරණ සහ මූල්‍යමය වශයෙන් දැරිය හැකි බවට සළකන්නේ නම් සහ යෝජිත අවදානම් අවම කිරීමේ ක්‍රමෝපාය ප්‍රමාණවත් බවට සලකන්නේ නම් සහ ව්‍යාපෘතිය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසුකම් සහ එවැනි අවදානමක් ගැනීම අවශ්‍ය වන්නේ නම්,

පමණක් මුදල් අමාත්‍යවරයා විසින් වාර්ෂික අයවැයට ඇතුළත් කළ හැකි ය.

(2) වාර්ෂික අයවැයට ඇතුළත් කිරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ අනුමතය ලබාගැනීම රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර ව්‍යාපෘති 42 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් ප්‍රමුඛතා ව්‍යාපෘති ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

(3) අනුමත කල රාජ්‍ය පෞද්ගලික හවුල්ව්‍යාපාර ව්‍යාපෘතියක් සඳහා ඒකාබද්ධ අරමුදලින් මුදල් වියදම් කිරීමේ දී ඒ සඳහා අදාළ මුදල් වර්ෂයේ විසර්ජන පනත මගින් මුදල් වෙන් කළ යුතු අතර රාජ්‍ය පෞද්ගලික හවුල්ව්‍යාපාර ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාලය පුරාවට දරන මුළු පිරිවැය වාර්ෂික අයවැය ලේඛනය මගින් හෙළිදරව් කළ යුතු ය.

(4) රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර ව්‍යාපෘතියක් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමතයෙන් පසුව -

(අ) මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ සියලු රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර ව්‍යාපෘති හා සම්බන්ධ අවිනිශ්චිත වගකීම් පිළිබඳ ඇස්තමේන්තුවක් ඇතුළත් කර ඇති බවට; සහ

(ආ) රාජ්‍ය පෞද්ගලික හවුල්ව්‍යාපාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඒවායේ මූල්‍ය බලපෑම් පිළිබඳ වාර්තා මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති බවට, මුදල් අමාත්‍යවරයා විසින් සහතික කළ යුතු ය.

ව්‍යාපෘති අධීක්ෂණය සහ ඇගයීම

**44.** (1) සෑම රාජ්‍ය අස්ථිත්වයක් ම, භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුකූලව, රාජ්‍ය පෞද්ගලික හවුල්ව්‍යාපාර ව්‍යාපෘති ඇතුළුව සියලු රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති වාර්ෂික අයවැය වෙන් කිරීම් තුළ නියමිත වේලාවට සහ භාණ්ඩාගාරයේ ලේකම්වරිය විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශවලට අනුකූලව සම්පූර්ණ කර ලබාදෙන බවට සහතික විය යුතු ය.

(2) අනුමත රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු එක් එක් ප්‍රධාන ගණන්දීමේ නිලධරයා හෝ ගණන්දීමේ නිලධරයා විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කළ යුතු අතර මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය මගින් මාසිකව අධීක්ෂණය කිරීම සඳහා එක් එක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම පිළිබඳ තොරතුරු සැපයිය යුතු ය.

(3) අදාළ ප්‍රධාන ගණකාධිකාරීගේ නිලධරයන් සහ ගණකාධිකාරීගේ නිලධරයන් විසින් සපයනු ලබන තොරතුරු මත පදනම්ව රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළව කඩිනම් ක්‍රමෝපාය තීරණ ගැනීමට සැලසුම්කිරීම, සම්පත් විභජනය කිරීම, අයවැයකරණය, මූල්‍යකරණය සහ අධීක්ෂණය සඳහා වගකිව යුතු අස්ථීත්ව ප්‍රධානීන්ගෙන් එකොළොස් දෙනෙකුට නොවැඩි සාමාජිකයන්ගෙන් සමන්විත අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන කමිටුවක් තිබිය යුතු ය.

(4) ව්‍යාපෘති අධීක්ෂණය සහ ඇගයීම සඳහා වගකිව යුතු දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා කමිටුවේ ලේකම්වරයා විය යුතු ය.

(5) කමිටුවේ කර්තව්‍ය සහ වගකීම්, සහ ව්‍යාපෘති අධීක්ෂණය සහ ඇගයීමේ ආකාරය නියම කරනු ලැබිය හැකි පරිදි විය යුතු ය.

(6) (1) වන උපවගන්තියේ සඳහන් යම් ව්‍යාපෘතියක තිරසරභාවයට සහ වියදම් දැරිය හැකිබාවයට බලපාන කොන්ත්‍රාත්තු හෝ ගිවිසුම්වල යම් සැළකිය යුතු වෙනස්කම් මුදල් අමාත්‍යවරයා විසින් කල්තියා අනුමත කළ යුතු ය. මුදල් අමාත්‍යවරයා විසින් අදාළ ලිඛිත නීති හෝ මාර්ගෝපදේශ සැලකිල්ලට ගනිමින් කොන්ත්‍රාත්තුවක හෝ ගිවිසුමක වෙනසක් සැලකිය යුතු වෙනසක් මත තීරණය කිරීම සඳහා වන නිර්ණායක තීරණය කළ හැකි ය.

**45.** (1) රාජ්‍ය ආයෝජන කමිටුව විසින් අනුමත කරන ලද සියලුම නව ව්‍යාපෘති සහ රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර ව්‍යාපෘති ඇතුළු ව දැනට ක්‍රියාත්මක වන රාජ්‍ය ආයෝජන ව්‍යාපෘතිවලට අදාළ තොරතුරු සහිත වාර්තාවක් වාර්ෂික අයවැය ලේඛනයට ඇතුළත් කළ යුතු ය. එම වාර්තාවේ - වාර්තා කිරීම

(අ) එක් එක් ව්‍යාපෘතියේ නම, ආරම්භක දිනය හෝ දිනයන් සහ අවසන් කිරීමට අපේක්ෂිත දිනය හෝ දිනයන්, ව්‍යාපෘතියේ අරමුණු හා විෂය පථය පිළිබඳ සාරාංශයක්;

(ආ) ව්‍යාපෘතිය සඳහා දැනටමත් දරන ලද වියදම ඇතුළුව ව්‍යපෘතියේ මුළු වියදම, මධ්‍යකාලීන වාර්ෂික වියදම් ඇස්තමේන්තුවක් සහ මුදල් සපයන මූලාශ්‍ර; සහ

(ඇ) මුදල් අමාත්‍යවරයා විසින් සුදුසු යයි සළකනු ලබන වෙනත් යම් තොරතුරක්,

අඩංගු විය යුතු ය.

(2) රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර ව්‍යාපෘති ඇතුළුව රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති පිළිබඳ යාවත්කාලීන දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම සඳහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා වගකිව යුතු ය.

## X වන කොටස

## ආණ්ඩුවේ ණය ගැනීම් සහ ඇපකර

රාජ්‍ය ණය කළමනාකරණය

**46.** රාජ්‍ය ණය සහ ආණ්ඩුවේ ඇපකර කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති සැලැස්ම මේ පනතේ III වන කොටසේ ඇති විධිවිධානවලට අනුකූල විය යුතු අතර අදාළ නීතිවලට යටත් විය යුතු ය.

## XI වන කොටස

## ගිණුම්කරණය සහ වාර්තා කිරීම

මූල්‍ය වාර්තා කිරීම

**47.** (1) රජයේ මූල්‍ය ප්‍රකාශ-

(අ) ජාත්‍යන්තර රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් මත පදනම්ව සකස් කරන ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කළ යුතු ය;

(ආ) ගිණුම්කරණ ප්‍රමිති අදාළ වන රාජ්‍ය අස්ථිත්වයන්ගේ ආදායම, වියදම, වත්කම් සහ බැරකම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීමේ දී සහ මූල්‍ය තොරතුරු මහජනතාවට හෙළිදරව් කිරීමේ දී විනිවිදභාවය ප්‍රවර්ධනය කළ යුතු ය; සහ

(ඇ) රාජ්‍ය අංශයේ මූල්‍ය වාර්තා කිරීම ප්‍රගතිය ඉලක්ක කරගත යුතු ය.

(2) අයවැය අස්ථිත්ව විසින් අදාළ ලිඛිත නීතිවල නිශ්චිතව දක්වා ඇති ආකාරයට සහ අදාළ කාලසීමා තුළ දී අවශ්‍ය විස්තර සහිතව වාර්ෂික මූල්‍ය ප්‍රකාශය සහ තොරතුරු පිළියෙල කර විගණකාධිපතිට ඉදිරිපත් කළ යුතු ය.

(3) මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් යම් අයවැය අස්ථිත්වයක් එම අවශ්‍යතාවයෙන් නිදහස් කරන්නේ නම් මිස, සෑම අයවැය අස්ථිත්වයක් විසින් ම ඒකාබද්ධ ගිණුම් සටහනක් භාවිත කළ යුතු ය. එම නිදහස් කිරීම ගිණුම් සහ වෙනත් මූල්‍ය ප්‍රකාශවල පිළිඹිබු විය යුතු ය.

(4) සෑම මූල්‍ය වර්ෂයක් අවසන් වීමෙන් දින එකසිය අසූවකට නොඅඩු කාලයක දී අදාළ ලිඛිත නීතීන් සහ ඒ යටතේ සාදන ලද නියෝගවල නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතා සපුරාලීම සඳහා අනෙකුත් ලියකියවිලි අතර ගිණුම් සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ ඇතුළත්-

(අ) 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ (i) වන අනුඡේදයෙන් ආවරණය වන එක් එක් රාජ්‍ය අස්ථිත්වයක් ම වාර්ෂික කාර්ය සාධන වාර්තාවක් පළ කළ යුතු ය; සහ

(ආ) 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ (ii) වන හා (iii) වන අනුඡේදවලින් ආවරණය වන එක් එක් රාජ්‍ය අස්ථිත්වයක් ම වාර්ෂික වාර්තාවක් පළ කළ යුතු ය.

(5) භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් ගිණුම්කරණය සහ වාර්තා කිරීම සඳහා වන උපදෙස්, විධාන, ක්‍රියාවලි, කාර්යපටිපාටි සහ පද්ධති වරින් වර නිකුත් කිරීම, පළ කිරීම සහ සමාලෝචනය කිරීම කළ යුතු ය.

(6) මේ පනතේ වෙනත් ආකාරයකට දක්වා ඇත්නම් මිස අයවැය අස්ථිත්වයන්ගේ ගිණුම් හා වෙනත් මූල්‍ය ප්‍රකාශ විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධානවලට අනුකූලව සිදු කළ යුතු ය.

තොරතුරු ඉල්ලා සිටීමට ඇති බලය

**48.** (1) 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ (i), (ii) වන හා (iii) වන අනුඡේදවල නිශ්චිතව දක්වා ඇති රාජ්‍ය අස්ථිත්වයන්ගෙන් වාර්තා හෝ අවස්ථාවෝචිත ලෙස-

(අ) මේ කොටසේ සඳහන් ප්‍රකාශ හා වාර්තා පිළියෙල කිරීම සඳහා අවශ්‍ය විය හැකි සහ භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි; සහ

(ආ) ඉහත අස්ථිත්වයනගේ මූල්‍ය කළමනාකරණයට අදාළ යම් කරුණක් පිළිබඳව,

වෙනත් යම් තොරතුරු ඉල්ලා සිටීමට භාණ්ඩාගාරයේ ලේකම්වරයාට බලය ඇත්තේ ය.

(2) (1) වන වගන්තිය යටතේ භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් ඉල්ලා ඇති තොරතුරු හා වාර්තා සෑම රාජ්‍ය අස්ථිත්වයක ම ප්‍රධානියා විසින් භාණ්ඩාගාරයේ ලේකම්වරයා නිශ්චිතව සඳහන් කර ඇති කාලරාමුව තුළ දී සහ එම ආකෘතිය අනුව ලබා දිය යුතු ය.

අයවැය ආර්ථිකය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව

**49.** (1) සෑම වර්ෂයක දී ම විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ දෙවන වර කියවීම සඳහා නියම කර ඇති දිනයේ දී, අයවැය ආර්ථිකය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට මූල්‍ය අමාත්‍යවරයා විසින් කටයුතු යෙදිය යුතු ය.

(2) වත්මන් මුදල් වර්ෂයට සහ පසුව එළඹෙන මුදල් වර්ෂයට අදාළව පහත දැක්වෙන තොරතුරු නියම කරන ලද ආකෘති පත්‍රයකින් අයවැය ආර්ථික සහ මූල්‍ය ඩිතත්ත්වය පිළිබඳ වාර්තාවේ අන්තර්ගත විය යුතු යː-

(අ) දළ දේශීය නිෂ්පාදිතයට අදාළ ඇස්තමේන්තු;

(ආ) පාරිභෝගික මිල ගණන්වලට සම්බන්ධ ඇස්තමේන්තු;

(ඇ) රැකියාව සහ විරැකියාව සම්බන්ධ ඇස්තමේන්තු;

(ඈ) ගෙවුම් ශේෂයේ වර්තමාන ජංගම ගිණුමේ තත්ත්වයට අදාළ ඇස්තමේන්තු;

(ඉ) ආදායම් හා වියදම් සම්බන්ධ ඇස්තමේන්තු;

(ඊ) ආණ්ඩුව විසින් ගනු ලබන ණය සම්බන්ධ ඇස්තමේන්තු;

(උ) (අ) සිට (ඊ) දක්වා වූ ඡේදවල නිශ්චිතව සඳහන් ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී උපයෝගී කරගනු ලැබූ පදනම, ආර්ථික හෝ වෙනත් දේ;

(ඐ) (අ) සිට (ඊ) දක්වා වූ ඡේදවල නිශ්චිතව සඳහන් ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී උපයෝගී කරගනු ලැබූ ආර්ථික හෝ වෙනත් පදනමක් සම්බන්ධයෙන් සිදුවිය හැකි වෙනස්වීම් කෙරෙහි බලපාන එම ඇස්තමේන්තුවල සංවේදීතාවයට අදාළ ප්‍රකාශයක්;

(එ) යම් ලිඛිත නීතියක් යටතේ ආණ්ඩුව විසින් ප්‍රදානය කරනු ලැබූ ඇපකර සහ මුක්තිදාන ඇතුළු අසම්භාව්‍ය බැරකම් වැනි මුදල් තත්ත්වය කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කළ හැකි අවදානම්, ප්‍රායෝගික වශයෙන් හැකිතාක් දුරට ප්‍රමාණාත්මක කළ ප්‍රකාශයක්;

(ඒ) (ඉ) ඡේදයේ සඳහන් ඇස්තමේන්තුවලට ඇතුළත් නොකළ ආණ්ඩුවේ වියදම් පිළිබඳව වූ ආණ්ඩුවේ යෝජනා සම්බන්ධයෙන් ජනතාව වෙත කරනු ලබන දැනුම්දීම;

(ඔ) අවසාන නොවී පවත්වාගෙන යමින් ඇති ආණ්ඩුවේ ප්‍රමන්ත්‍රණ මුල් ප්‍රකාශය පළ කිරීමේ සිට මේ දක්වා අවසාන නොවී පවත්වාගෙන යමින ඇති ආණ්ඩුවේ ප්‍රමන්තන මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයට සහ මධ්‍ය කාලීන මූල්‍ය රාමුවට සිදු කරන ලද යාවත්කාලීන කිරීම්; සහ

(ඕ) එක් එක් මුදල් වර්ෂය සම්බන්ධයෙන් ආණ්ඩුවේ මුදල් තත්ත්වය සාධාරණ ලෙස පිළිබිඹු කර දැක්වීමට අවශ්‍ය වෙනත් තොරතුරු.

(3) (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව අයවැය ආර්ථික හා මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවේ අන්තර්ගත තොරතුරු සැපයීමේ දී මුදල් සහ ආර්ථික තත්ත්වය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් කෙරෙන ආණ්ඩුවේ සියලුම තීරණ හා වෙනත් සියලු පරිවේෂණ කෙරෙහි හැකිතාත් දුරට සැලකිල්ලක් දැක්විය යුතු ය.

(4) මුදල් අමාත්‍යවරයාගේ ලිඛිත මතය අනුව -

(අ) ජාතික ආරක්ෂාවට අගතිකාරී වන; හෝ

(ආ) ප්‍රමන්ත්‍රණ, නඩු පැවරීම් හෝ වාණිජ කටයුතු කෙරෙහි සැළකිය යුතු ආකාරයකට ශ්‍රී ලංකාව පාත්‍ර කරවන,

යම් විස්තරයක් හෝ තොරතුරක් අයවැය ආර්ථික හා මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවෙහි ඇතුළත් කිරීමට, යම් තොරතුරක් හෙළිදරව් කිරීමට නියම කරන්නේ යයි මේ වගන්තියේ ඇතුළත් කිසිවක් කියවා තේරුම් නොගත යුතු ය.

(5) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසු වාර්තාව මුදල් අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය.

**වර්ෂය මැද මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව**

**50.** (1) ආණ්ඩුවේ ප්‍රකාශයෙහි දක්වා ඇති මූල්‍ය ක්‍රමෝපාය හා සසඳමින් ආණ්ඩුවේ වර්ෂය මැද මූල්‍ය කාර්යසාධනය ඇගයීමේ පදනමක් වශයෙන් යොදා ගැනීමට එක් එක් මුදල් වර්ෂය ම සම්බන්ධයෙන් වර්ෂය මැද මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාවක්, මහජනයා වෙත නිකුත් කිරීමට අමාත්‍යවරයා විසින් කටයුතු යෙදිය යුතු ය.

(2) මුදල් වර්ෂය සම්බන්ධයෙන් වර්ෂය මැද මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාවේ පහත දැක්වෙන කරුණු ඇතුළත් විය යුතු ය:-

(අ) ඒ වර්ෂයේ පළමු මාස හය සඳහා ඇස්තමේන්තු කරන ලද වියදම සහ සැබෑ වියදම පිළිබඳ ප්‍රකාශයක්;

(ආ) ඒ වර්ෂයේ පළමු මාස හය සඳහා ඇස්තමේන්තු කරන ලද ආදායම සහ සැබෑ ආදායම පිළිබඳ ප්‍රකාශයක්;

(ඇ) ඒ වර්ෂයේ පළමු මාස හය සඳහා ඇස්තමේන්තු කරන ලද මුදල් ප්‍රමාහය සහ සැබෑ මුදල් ප්‍රමාහය පිළිබඳ ප්‍රකාශයක්;

(ඈ) ඒ වර්ෂයේ පළමු මාස හය සඳහා ඇස්තමේන්තු කරන ලද ණයට ගැනීම් සහ සැබෑ ණයට ගැනීම් පිළිබඳ ප්‍රකාශයක්; සහ

(ඉ) ඒ මුදල් වර්ෂයේ පළමු මාස හය සම්බන්ධයෙන් ආණ්ඩුවේ මුදල් තත්ත්වය ප්‍රමාණවත් ලෙස පිළිබිඹු කිරීමට අවශ්‍ය වෙනත් ප්‍රකාශ.

(3) ඇස්තමේන්තුගත ආදායමේ හෝ මුදල් ප්‍රවාහයෙහි හෝ හිඟතාවයක් නැතහොත් ඇස්තමේන්තු කළ වියදමේ හෝ ණයට ගැනීම්වල හෝ අතිරික්තයක් ඇත්නම්, ඒ හිඟතාවයට හෝ අතිරික්තයට හේතු වර්ෂය මැද මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාවෙන් ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.

(4) 5 වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව වර්ෂය මැද මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාවේ අන්තර්ගත තොරතුරු සැපයීමේ දී ඒ වර්ෂය සඳහා විසර්ජන පනත සම්මත කරනු ලැබීමෙන් පසු ගනු ලැබූ තීරණ සහ තත්කාලයේ පවත්නා පරිවේෂණ ඇතුළුව මූල්‍ය තත්ත්වය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ලැබිය හැකි ආණ්ඩුවේ සියලුම තීරණ හා වෙනත් සියලු පරිවේෂණ, හැකිතාක් දුරට, සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(5) මුදල් අමාත්‍යවරයාගේ ලිඛිත මතය අනුව-

(අ) ජාතික ආරක්ෂාවට අගතිකාරී වන; හෝ

(ආ) ප්‍රමන්ත්‍රණ, නඩු පැවරීම් හෝ වාණිජ කටයුතු කෙරෙහි සැලකිය යුතු ආකාරයට ශ්‍රී ලංකාව පාත්‍ර කරනු ලැබිය හැකි,

යම් විස්තරයක් හෝ තොරතුරක් මධ්‍යකාලීන මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාවෙහි ඇතුළත් කිරීමට නියම කරන්නේ යයි මේ වගන්තියේ ඇතුළත් කිසිවක් කියවා තේරුම් නොගත යුතු ය.

(6) වර්ෂය මැද මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවක ඇතුළත් කිරීමට නියමිත යම් කරුණක් පිළිබඳ යම් තොරතුරක්, අවසාන වරට නිකුත් කළ අයවැය ආර්ථික සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවේ ඒ කරුණට අදාළ තොරතුරුවලට වඩා වෙනස් නොවී ඇති අවස්ථාවක දී ඒ තොරතුරු එසේ නොවෙනස්ව පවත්නා බව වර්ෂය මැද මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවේ සඳහන් කරනු ලැබිය යුතු ය.

(7) වර්ෂය මැද මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව, අදාළ වර්ෂයේ ඔක්තෝබර් මස අවසාන දින හෝ විසර්ජන පනත සම්මත කර මාස දහයක් ගතවීම හෝ යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ දී මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ නිල වෙබ් අඩවියේ පළකරනු ලැබිය යුතු ය.

(8) මුදල් අමාත්‍යවරයා විසින් -

(අ) වර්ෂය මැද මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව නිකුත් කරන ලද දිනය පාර්ලිමේන්තුව රැස්වන දිනයක් වේ නම්, ඒ වාර්තාව නිකුත් කරන ලද දින සිට සති දෙකක් තුළ දී ඒ

වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට කටයුතු යෙදිය යුතු ය; හෝ

(ආ) වර්ෂය මැද මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව නිකුත් කරන ලද දිනය පාර්ලිමේන්තුව රැස්වන දිනයක් නොවන්නේ නම්, පාර්ලිමේන්තුව ඊළඟට රැස්වන දින සිට සති දෙකක් තුළ දී ඒ වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට කටයුතු යෙදිය යුතු ය.

අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව

**51.** (1) ආණ්ඩුවේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයෙහි දක්වා ඇති මූල්‍ය ක්‍රමෝපාය හා සසඳමින් ආණ්ඩුවේ වාර්ෂික මූල්‍ය කාර්ය සාධනය ඇගයීමේ පදනමක් වශයෙන් යොදා ගැනීමට එක් එක් මුදල් වර්ෂය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ කොටසක් වශයෙන් අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවක්, මහජනයා වෙත නිකුත් කිරීමට අමාත්‍යවරයා විසින් කටයුතු යෙදිය යුතු ය.

(2) මුදල් වර්ෂයක් වෙනුවෙන් අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවට පහත දැක්වෙන කරුණු ඇතුළත් විය යුතු යඃ-

(අ) ඒ වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ වියදම සහ සැබෑ වියදම පිළිබඳ ප්‍රකාශයක්;

(ආ) ඒ වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ ආදායම සහ සැබෑ ආදායම පිළිබඳ ප්‍රකාශයක්;

(ඇ) ඒ වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ මුදල් ප්‍රවාහය සහ සැබෑ මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශයක්;

(ඈ) ඒ වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ ණයට ගැනීම් සහ සැබෑ ණයට ගැනීම් පිළිබඳ ප්‍රකාශයක්; සහ

(ඉ) ඒ මුදල් වර්ෂය අවසානයේ දී ආණ්ඩුවේ මූල්‍ය තත්ත්වය ප්‍රමාණවත් ලෙස පිළිබිඹු කිරීමට අවශ්‍ය වෙනත් ප්‍රකාශ.

(3) ඇස්තමේන්තු කළ ආදායමේ හෝ මුදල් ප්‍රවාහයේ හෝ යම් හිඟතාවයක් ඇතිවුවහොත්, නැතහොත් ඇස්තමේන්තු කළ වියදමේ හෝ ණයට ගැනීම්වල හෝ අතිරික්තයක් තිබෙන විට ඒ හිඟතාවයට හෝ අතිරික්තයට හේතු එකී අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවෙහි ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.

(4) අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව, මුදල් වර්ෂය අවසාන වී මාස හයක් ගතවීමට පෙර මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය.

(5) මුදල් අමාත්‍යවරයා විසින් -

(අ) අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව නිකුත් කරන ලද දිනය පාර්ලිමේන්තුව රැස් වන දිනයක් වේ නම්, ඒ වාර්තාව නිකුත් කරන ලද දින සිට සති දෙකක් තුළ දී ඒ වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට කටයුතු යෙදිය යුතු ය; හෝ

(ආ) අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව නිකුත් කරන ලද දිනය පාර්ලිමේන්තුව රැස්වන දිනයක් නොවන්නේ නම්, පාර්ලිමේන්තුව ඊළඟට රැස්වන දින සිට සති දෙකක් තුළ දී ඒ වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට කටයුතු යෙදිය යුතු ය.

(6) මුදල් වර්ෂයක අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව, යම් මුදල් වර්ෂයක් ආරම්භවීමෙන් පසු ඒ මූල්‍ය වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරන අයවැය ආර්ථික සහ මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාව සමග ඒකාබද්ධ කරනු ලැබිය හැකි ය,

**මැතිවරණ පූර්ව අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව**

**52.** (1) පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුන් තෝරා පත්කර ගැනිම සඳහා මහ මැතිවරණයක් පැවැත්වීමට නියම කරමින් ප්‍රකාශනයක් හෝ ආඥාවක් ප්‍රසිද්ධ කර සති තුනක් ඇතුළත දී, රටේ මුදල් තත්ත්වය පිළිබඳ තොරතුරු ඇතුළත් මැතිවරණ පූර්ව අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවක් මහජනයා වෙත නිකුත් කිරීමට මුදල් භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් කටයුතු යෙදිය යුතු ය.

(2) තත්කාලීන මුදල් වර්ෂය සඳහා වූ පහත දැක්වෙන තොරතුරු, මැතිවරණ පූර්ව අයවැය තත්ත්වය පිළිබඳ සෑම වාර්තාවක ම අන්තර්ගත විය යුතු යः-

(අ) ආදායම සහ වියදම පිළිබඳ ඇස්තමේන්තු;

(ආ) ආණ්ඩුවේ ණය පිළිබඳ ඇස්තමේන්තු;

(ඇ) එම ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී උපයෝගී කර ගත් ආර්ථික සහ වෙනත් ආදාන;

(ඈ) මුදල් තත්ත්වය කෙරෙහි සැලකිය යුතු ලෙස බලපාන -

(i) යම් පනතක් යටතේ ආණ්ඩුව විසින් දෙන ලද ඇපකර සහ මුක්තිදාන ඇතුළු අසම්භාව්‍ය බැරකම්;

(ii) (අ) ඡේදයේ සඳහන් ඇස්තමේන්තුවල ඇතුළත් නොකළ, ආණ්ඩුව විසින් වැය කරනු ලබන බවට ප්‍රසිද්ධියේ පළ කරන ලද යෝජනා; සහ

(iii) පවත්වාගෙන යන අවසන් නොවූ ආණ්ඩුවේ ප්‍රමන්ත්‍රණ,

වැනි ප්‍රමාණීකෘත කළ අවදානම් පිළිබඳ ප්‍රයෝගිකව හැකි තාක් දුරට, පිළියෙල කළ ප්‍රකාශයක්; සහ

(ඉ) එකී වාර්තාවේ දිනයේ දී පැවැති මූල්‍ය තත්ත්වය යුක්ති සහගතව පිළිබිඹු කර දැක්වීමට අවශ්‍ය වෙනත් තොරතුරු.

(3) මුදල් තත්ත්වය පිළිබඳව සැලකිය යුතු බලපෑමක් ඇති කරන ආණ්ඩුවේ යම් තීරණයක් හැකිතාක් පුළුල් ප්‍රමාණයට (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මැතිවරණ පූර්ව අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවේ තොරතුරුවලට ඇතුළත් විය යුතු ය.

(4) මුදල් අමාත්‍යවරයාගේ ලිඛිත මතය අනුව -

(අ) ජාතික ආරක්ෂාවට අගතිකාරී වන; හෝ

(ආ) ප්‍රමන්ත්‍රණ, නඩු පැවරීම් හෝ වාණිජ කටයුතු කෙරෙහි සැලකිය යුතු ආකාරයට ශ්‍රී ලංකාව පාත්‍ර කරවන,

යම් විස්තරයක් හෝ තොරතුරක් මැතිවරණ පූර්ව අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවේ ඇතුළත් කිරීමට නියම කරන්නේ යයි මේ වගන්තියේ ඇතුළත් කිසිවක් කියවා තේරුම් නොගත යුතු ය.

(5) මැතිවරණ පූර්ව අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවක ඇතුළත් කළ යුතු යයි නියමිත යම් තොරතුරක්, කලින් වූ අයවැය ආර්ථික හා මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවක හෝ වර්ෂය මැද අයවැය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවක ඒ කාරණය සම්බන්ධයෙන් ඇතුළත් කොට තිබූ තොරතුරුවලින් නොවෙනස්ව පවත්නා අවස්ථාවක දී ඒ තොරතුරු එකී වාර්තා දෙකින් එකක හෝ ඒ

වාර්තා දෙකෙහි ම හෝ අඩංගු තොරතුරුවලින් නොවෙනස්ව පවත්නා බව ඒ මැතිවරණ පූර්ව අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවෙහි සඳහන් කරනු ලැබිය යුතු ය.

(6) සෑම මැතිවරණ පූර්ව අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවක් සමඟ ම පහත දැක්වෙන ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබිය යුතු යː-

(අ) අමාත්‍යවරයා විසින් (8) වන උපවගන්තියේ නියමයන්ට අනුකූලව කටයුතු කර ඇති බවට අමාත්‍යවරයා විසින් අත්සන් කරන ලද ප්‍රකාශයක්;

(ආ) වාර්තාවේ අඩංගු තොරතුරු මගින් හැකි තරම් පුළුල් ලෙස -

(i) අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ නිලධරයන්ගේ උපරිම වෘත්තිය විනිශ්චය පිළිබිඹු වන බවට;

(ii) අමාත්‍යාංශය විසින් ලබාගත හැකි වූ සියලුම ආර්ථික හා මූල්‍ය තොරතුරු කෙරෙහි සැලකිල්ල දක්වා ඇති බවට; සහ

(iii) (8) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් තමාට අනාවරණය කළ ආණ්ඩුවේ තීරණවලින් ඇතිවන මූල්‍ය පැටලිලි හා වෙනත් පරිවේෂණ එකී තොරතුරුවලට ඇතුළත් කොට ඇති බවට,

භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් කරන ලද ප්‍රකාශයක්.

(7) නව පාර්ලිමේන්තුව පළමුවරට රැස් වූ දින සිට සති දෙකක් ඇතුළත (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට මුදල් අමාත්‍යවරයා විසින් කටයුතු යෙදිය යුතු අතර ඒ වාර්තාව මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය.

(8) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීම සඳහා මහ මැතිවරණයක් පැවැත්වීමට නියම කරන ප්‍රකාශනය හෝ ආඥාව ප්‍රසිද්ධ කිරීමෙන් පසුː-

(අ) අමාත්‍යවරයා දන්වා වූ; සහ

(ආ) සැලකිය යුතු ප්‍රමාණයකට මූල්‍ය හෝ ආර්ථික පැටලිලි ඇති කරවන්නා වූ හෝ ඇති කිරීමට ඉඩ ඇති,

ආණ්ඩුවේ තීරණ සහ වෙනත් පරිවේෂණ, මේ වගන්තිය යටතේ මැතිවරණ පූර්ව අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවක් පිළියෙල කිරීමට භාණ්ඩාගාරයේ ලේකම්වරයාට හැකි වනු පිණිස, එකී ප්‍රකාශනය හෝ ආඥාව ප්‍රසිද්ධ කොට එක් සතියක් තුළ දී අමාත්‍යවරයා විසින් භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත අනාවරණය කරනු ලැබිය යුතු ය.

මුදල් අමාත්‍යාංශයේ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ වාර්තාවක්

**53.** (1) අවම වශයෙන් කාර්තුමය පදනමක් මත මුදල් අමාත්‍යවරයා විසින් රජයේ ආදායම් හා වියදම් ඇතුළු මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශයක් අමාත්‍ය මණ්ඩලයට සැපයිය යුතු අතර ඒ ප්‍රකාශය එක් එක් කාර්තුව අවසානයේ දින හතළිස් පහකට නොඅඩු දිනයක දී, නියම කරනු ලැබ ඇති ආකාරයට මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ සමගාමීව පළ කරනු ලැබිය යුතු ය.

(2) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක නිශ්චිතව සඳහන් කර ඇති පරිදි ආණ්ඩුවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් හෝ බලයලත් නිලධරයකු විසින් සකස් කර විගණකාධිපතිට ඉදිරිපත් කළ යුතු ය.

(3) මුදල් වර්ෂය අවසන් වී දින එකසිය අසූවකට නොඅඩු කාලයක දී භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් ආණ්ඩුවේ විගණනය කළ මූල්‍ය වාර්තාව සහ ඒ පිළිබඳ විගණකාධිපතිගේ මතය සමග රජයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ සහ අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව සහ රජයට අයත් ව්‍යවසායන්ගේ කාර්ය සාධනය පිළිබඳ පරිච්ඡේදය ඇතුළත් වාර්ෂික වාර්තාව නියම කරන ලද ආකෘති පත්‍රයෙන් සහ නියම කරන ලද ආකාරයට සකස් කළ යුතු ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් වාර්ෂික වාර්තාව මුදල් අමාත්‍යවරයා විසින් මුදල් වර්ෂය අවසන් වී දින එකසිය අසූවකට නොඅඩු දිනයක දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල යුතු ය. ඒ වාර්තාව මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය.

**කපා හැරීම සහ අත්හැරීම**

**54.** (1) නිලධරයකුගේ හෝ නිලධරයන්ගේ ප්‍රමාදය, නොසැලකිල්ල, වරදක් හෝ වංචාවක් හේතුවෙන් හෝ මේ පනතේ විධිවිධානවලට හෝ මේ පනත යටතේ නිකුත් කරන ලද නියෝග හෝ නියමයන්ට අනුකූල නොවීම හේතුවෙන් සිදු වූ පාඩුවක් කපා හැරීමක් ලෙස සළකනු ලැබේ.

(2) පාඩු කපා හැරීම සඳහා වූ යම් හිමිකම්පෑමක් භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් අදාළ ලිඛිත නීතීන්ට යටත්ව සහ නියම කරන ලද පාඩු සීමාව සැලකිල්ලට ගෙන සලකා බැලිය යුතු ය.

(3) අත්හැර දැමීම යනු රජයට අයවීමට ඇති යම් මුදල් ප්‍රමාණයක් අත්හැර දැමීම හෝ අවලංගු කිරීම වේ. පාඩුවලින් පැන නගින අත්හැරීම් හැර, අත්හැරීම් පහත දැක්වෙන පරිදි විශේෂ කාණ්ඩ දෙකකට අයත් වේ:-

(අ) ඇතැම් ප්‍රඥප්ති ක්‍රියාත්මක කිරීමේ දී රජයේ ආදායම් හෝ රජයට අයවීමට ඇති මුදල් අත්හැරීම සඳහා එම ප්‍රඥප්ති මගින් බලය පවරන ලද නිලධරයන්ට බලය ලබා දෙයි. එසේ බලය පවරන ලද නිලධාරීන් හට යම් ආදායම් අයිතම හෝ රජයට අයවීමට ඇති වෙනත් මුදල් හෝ වැඩිදුරටත් අධිකාරී බලය පැවරීමකින් තොරව අවලංගු කිරීම හෝ අත්හැරීම කළ හැකි ය.

(ආ) (i) යම් ප්‍රඥප්තියක් මගින් ආදායම එකතු කිරීමට බලය පවරා ඇති විට සහ හිමිකම්පෑමක් අත්හැරීමට හෝ කපා හැරීමට විධිවිධාන සළසා නොමැති විට; සහ

(ii) මේ වගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන යටතට හෝ මේ ඡේදයේ (i) වන අනුඡේදයේ විධිවිධාන යටතට නොවැටෙන ආපසු අයකර ගත නොහැකි ආදායම හෝ රජයට අයවීමට ඇති වෙනත් මුදල් අත්හැරීමට,

භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ අධිකාරී බලය ලබා ගත යුතු ය.

(4) පාඩුවක් හෝ අලාභයක් සම්බන්ධයෙන් ක්‍රියා, කිරීමට අධිකාරී සීමාවන්, කාලසීමාවන් සහ විමර්ශනය කිරීම, වාර්තා කිරීම, අයකර ගැනීම සහ කපා හැරීම සම්බන්ධව මඟපෙන්වීම යන කරුණු පිළිබඳ විස්තර නියම කරනු ලබන පරිදි විය යුතු ය.

## XII වන කොටස

## රජයට අයත් ව්‍යවසායන්

මේ කොටසේ විධිවිධාන අදාළ කර ගැනීම

**55.** මේ කොටසේ විධිවිධාන 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ (iii) වන අනුඡේදයේ නිශ්චිතව දක්වෙන රජයට අයත් ව්‍යවසායන්ට අදාළ වේ.

රජයට අයත් ව්‍යවසායන් පිළිබඳව මුදල් අමාත්‍යවරයාට ඇති අධිකාරී බලය

**56.** මුදල් අමාත්‍යවරයාට පහත සඳහන් බලතල ඇත්තේ යඃ-

(අ) රජයට සිදුවන වියදම් සහ රජයට අයත් ව්‍යවසායන් පිහිටුවීම හා සම්බන්ධ අවදානම් ඇතුළුව එක් එක් රජයට අයත් ව්‍යවසායන් පිහිටුවීම, වසා දැමීම හෝ ඒකාබද්ධ කිරීම සඳහා වන යෝජනා සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයට මතයක් ප්‍රකාශ කිරීම;

(ආ) රජයට අයත් ව්‍යවසායන්හි කාර්ය සාධනය ඉහළ නැංවීම ඉලක්ක කරගත් ඒකාබද්ධ පාලන මාර්ගෝපදේශ නිකුත් කිරීම;

(ඇ) රජයට අයත් ව්‍යවසායන් පිළිබඳ මූල්‍ය අධීක්ෂණය ක්‍රියාත්මක කිරීම; සහ

(ඈ) වෙනත් යම් ලිඛිත නීතියක් මගින් නිශ්චිතව දක්වා ඇති වෙනත් යම් බලයක් ක්‍රියාත්මක කිරීම.

රජයට අයත් ව්‍යවසාය සම්බන්ධයෙන් අදාළ අමාත්‍යවරයා සතු අධිකාරී බලය

**57.** (1)අදාළ අමාත්‍යවරයා විසින්, 56 වන වගන්තියට අනුව, රජයට අයත් ව්‍යවසායක් පිහිටුවීම සඳහා යම් යෝජනාවක් පහත සඳහන් අවස්ථාවලදී ඉදිරිපත් නොකළ යුතු ය.

(අ) අදාළ අස්ථිත්වයේ අවශ්‍යතාවය පිළිබඳ පැහැදිළි සාධාරණීකරණයක් නොමැතිවිට;

(ආ) අදාළ අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ විෂය පථයට නොවැටෙනවිට;

(ඇ) අදාළ අමාත්‍යවරයාගේ අමාත්‍යංශය යටතේ හෝ වෙනත් යම් අමාත්‍යංශයක් යටතේ සමාන කර්තව්‍ය සහිත වෙනත් යම් රජයට අයත් ව්‍යවසායක් ඇති විට; හෝ

(ඈ) ආණ්ඩුවට සිදුවන පිරිවැය ද ඇතුළුව එවැනි පිහිටුවීම හෝ සංස්ථාගත කිරීම හා සම්බන්ධ දිගු කාලීන ප්‍රතිලාභ සහ අවදානම් සැළකිල්ලට නොගෙන ඇති විට

(2) අදාළ අමාත්‍යවරයා විසින්-

(අ) 61 වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති ලේඛන ඉදිරිපත් කිරීම ඇතුළුව අමාත්‍යවරයාගේ විෂය පථය යටතේ ඇති සෑම රජයට අයත් ව්‍යවසායක් විසින් ම මුදල් අමාත්‍යවරයාට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරන බවට;

(ආ) රජයට අයත් ව්‍යවසායන් හි වාර්ෂික අයවැය, මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයට අනුකූල වන බවට; සහ

(ඇ) රජයට අයත් ව්‍යවසායන් හි වාර්ෂික අයවැය මගින් අවදානම් සාධක සහ එම අවදානම් අවම කිරීමේ ක්‍රමෝපාය පෙන්නුම් කරන බවට,

සහතික විය යුතු ය.

රජයට අයත් ව්‍යවසාය සම්බන්ධයෙන් භාණ්ඩාගාර ලේකම්ට ඇති බලතල හා කාර්යය

**58.** (1) රජයට අයත් ව්‍යවසායන් හි වගවීම සහ පාලන අවශ්‍යතා, ඒවායේ මූල්‍ය කාර්ය සාධනය සමාලෝචනය කිරීම සහ පරිපාලනය, අයවැය, ප්‍රසම්පාදනය, ආයෝජනය, මූල්‍යකරණය සහ වාර්තා කිරීම ඇතුළත් වෙනත් යම් කරුණු සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් අවශ්‍ය යයි සලකන්නේ නම්, අදාළ ලිඛිත නීතින්ට යටත්ව, ප්‍රතිපත්ති කාරණා පිළිබඳව විධාන නිකුත් කළ හැකි ය.

(2) රජයට අයත් ව්‍යවසායන්හි සියලු කොටස් හිමිකම් පිළිබඳව භාණ්ඩාගාරයේ ලේකම්වරයා වාර්තාවක් තබාගත යුතු ය.

රජයට අයත් ව්‍යවසායන්හි අයවැය

**59.** (1) සෑම රජයට අයත් ව්‍යවසායක් විසින් ම සෑම මුදල් වර්ෂයකට ම අදාළව තම අයවැය සකස් කළ යුතු අතර එම අයවැය අදාළ වන මුදල් වර්ෂය ආරම්භවීමට දින පහළොවකට පෙර එම රජයට අයත් ව්‍යවසායේ පාලක මණ්ඩලය විසින් එම අයවැය අනුමත කළ යුතු ය.

(2) යම් රජයට අයත් ව්‍යවසායකට වාර්ෂික අයවැයෙන් මුදල් ලබාදෙන්නේ නම්, භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් නිකුත් කරන ලද අයවැය කැඳවීම් චක්‍රලේඛයේ විධිවිධාන අනුව රජයට අයත් ව්‍යවසාය විසින් තම අයවැය ඇස්තමේන්තු සකස් කළ යුතු ය.

(3) රජයට අයත් ව්‍යවසායක සෑම පාලක මණ්ඩලයක් ම, ඒ රජයට අයත් ව්‍යවසායේ අයවැය ඇස්තමේන්තුවේ ප්‍රාග්ධන වියදම් සම්බන්ධයෙන් මේ පනත යටතේ සාදන නියෝගවලට අනුකූල විය යුතු ය.

**රජයට අයත් ව්‍යවසායන්හි බදු හෝ ලාභාංශ**

**60.** (1) භාණ්ඩාගාරයේ ලේකම්වරයා විමසා, අදාළ අවස්ථාවක දී රජයට අයත් ව්‍යවසායන් හි අදාළ පාලක මණ්ඩලය විසින් සකස් කරනු ලබන බදු සහ ලාභාංශ ප්‍රතිපත්තියක් තිබිය යුතු ය. බද්දක් පැනවීම සහ මුදල් අමාත්‍යවරයා විසින් රජයට අයත් ව්‍යවසායක් එවැනි බද්දක් පැනවීමෙන් නිදහස් කරන යම් තීරණයක් 53 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ වාර්ෂික වාර්තාවේ පළ කරනු ලැබිය යුතු ය.

(2) රජයට අයත් ව්‍යාපාර විසින් රජයට ගෙවනු ලබන ලාභාංශ හෝ වෙනත් ලාභ බෙදා හැරීම ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු අතර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ පිළිඹිබු විය යුතු ය.

(3) 53 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ වාර්ෂික වාර්තාව මගින් භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් බදු හෝ ලාභාංශ වශයෙන් එකතු කරගත් මුදල් පිළිබඳව හෙළිදරව් කළ යුතු ය.

(4) මේ වගන්තිය යටතේ බදු හෝ ලාභාංශ වශයෙන් ගෙවන ලද මුදල් සම්බන්ධයෙන් හිලව් කිරීමේ බදු සහනයක් ප්‍රදානය කරනු නොලැබිය යුතු ය.

**රජයට අයත් ව්‍යවසායන්හි වාර්තා**

**61.** (1) සියලු රජයට අයත් ව්‍යවසාය විසින් -

(අ) මධ්‍ය කාලීන ක්‍රමෝපාය හෝ සංයුක්ත සැලැස්ම;

(ආ) වාර්ෂික අයවැය, ප්‍රාග්ධන ව්‍යාපෘති සහ ප්‍රසම්පාදන සැලැස්ම පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම;

(ඇ) වාර්ෂික වාර්තාවක්; සහ

(ඈ) නියම කරනු ලැබිය හැකි වෙනත් යම් වාර්තාවක්,

සකස් කර භාණ්ඩාගාරයේ ලේකම්වරයාට ඉදිරිපත් කළ යුතු ය.

(2) භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින්, කලින් කලට, (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාවලට අදාළ ආකෘති, කාලසීමා සහ විධාන පළ කළ යුතු ය.

(3) එක් එක් මුදල් වර්ෂය අවසාන වන දින සිට මාස දෙකකට නොඅඩු කාලයක දී යම් ලිඛිත නීතියකින් නියම කරන ලද ප්‍රකාශන සහ ලේඛන ද සමග ඒ රජයට අයත් ව්‍යවසායේ අනුමත මූල්‍ය ප්‍රකාශය ඇතුළත් අයවැය ලේඛනයේ කෙටුම්පතක් ඒ රජයට අයත් ව්‍යවසාය විසින් විගණකාධිපතිට ඉදිරිපත් කළ යුතු අතර ඒ ලේඛනවල පිටපත් අදාළ අමාත්‍යවරයාට සහ මුදල් අමාත්‍යවරයාට ද ඉදිරිපත් කළ යුතු ය.

(4) විගණකාධිපතිගේ මතය ලැබීමෙන් පසු සහ සෑම මුදල් වර්ෂයක් ම අවසන් වී දින එකසිය අසූවකට පෙර, රජයට අයත් ව්‍යවසාය විසින් අදාළ අමාත්‍යවරයාට සහ මුදල් අමාත්‍යවරයාට ඒ වාර්තාවල පිටපත් ද සමග වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු අතර ඒ වාර්තාව අදාළ රජයට අයත් ව්‍යවසායේ වෙබ් අඩවියේ ද පළ කරනු ලැබිය යුතු ය.

XIII වන කොටස

**පළාත් සභා සහ පළාත් පාලන ආයතන**

විනිවිදභාවයේ සහ මූල්‍ය වගකීමේ ප්‍රතිපත්ති පිළිපැදිය යුතු බව

**62.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට සහ අදාළ ලිඛිත නීතිවලට යටත්ව පළාත් සභා සහ පළාත් පාලන ආයතන රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පනත යටතේ නියම කර ඇති විනිවිදභාවයේ සහ මූල්‍ය වගකීමේ ප්‍රතිපත්ති අනුගමනය කළ යුතු ය.

(2) මුදල් අමාත්‍යවරයා විසින් ඉල්ලා සිටිය හැකි පරිදි පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආදායම් සහ වියදම් සහ වෙනත් මූල්‍ය තොරතුරු පිළිබඳ වාර්තා පළාත් සභා සහ පළාත් පාලන ආයතන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ යුතු ය.

**XIV වන කොටස**

**සේවක සංඛ්‍යාව කළමනාකරණය**

සේවක සංඛ්‍යාව කළමනාකරණය

**63.** (1) මේ පනතේ අරමුණු ඉටු කර ගන්නා ආකාරයට රාජ්‍ය අස්ථිත්වයක සේවක සංඛ්‍යාව කළමනාකරණය කිරීමේ බලය මුදල් අමාත්‍යවරයා වෙත පැවරී තිබිය යුතු ය.

(2) සේවක සංඛ්‍යාව කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයාගේ වගකීම්වලට රජයේ අස්ථිත්වයන්ගේ නිලධරයන්ට සහ වෙනත් සේවානියුක්තයන්ට වැටුප් සහ පඩි සහ වෙනත් ගෙවීම් නිශ්චය කිරීම ඇතුළත් වේ.

## XV වන කොටස

### වැරදි සහ දණ්ඩන

රජයේ නිලධාරීන් සහ රජයට අයත් අස්ථිත්වයක පාලන මණ්ඩලය විසින් මූල්‍ය විෂමාචාර ක්‍රියා සිදු කිරීම

**64.** (1) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් යටතේ බලය හෝ රාජකාරී ලබා දී හෝ පවරා ඇති රාජ්‍ය අස්ථිත්වයක නිලධරයකු හෝ සේවා නියුක්තයකු විසින් සිතා මතා හෝ නොසැළකිලිමත් ලෙස, යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් මගින් නීති විරෝධී, අනවසර, අක්‍රමවත් හෝ නාස්තිකාර වියදම් කරන්නේ නම් හෝ රාජ්‍ය මූල්‍ය හෝ රාජ්‍ය දේපළ වැරදි ලෙස භාවිතා කරන්නේ නම් හෝ ඊට අවසර ලබා දෙන්නේ නම් ඒ නිලධරයා හෝ සේවා නියුක්තයා මූල්‍ය විෂමාචාර ක්‍රියාවක් සිදු කරන අතර විනය ක්‍රියාමාර්ගයකට යටත් වන්නේ ය.

(2) අදාළ රාජ්‍ය අස්ථිත්වයේ ප්‍රධානියා චූදිත නිලධරයාට එරෙහිව වහාම විනය ක්‍රියාමාර්ග ගැනීම හෝ බහුමූල්‍ය විෂමාචාරය සිදු කළ චූදිත නිලධරයාගේ විනය බලධරයා නොවන අවස්ථාවක දී (1) වන වගන්තිය යටතේ මූල්‍ය විෂමාචාරයට යටත්වන නිලධරයාට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගන්නා ලෙස අදාළ විනය බලධරයාට වහාම දැනුම් දීම සිදු කළ යුතු ය.

(3) (අ) පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝගයක් හෝ රීතියක් යටතේ වරදක් සිදු කරනු ලැබ ඇති අවස්ථාවක දී -

(i) සංස්ථාපිත මණ්ඩලයක් නම් ඒ සංස්ථාපිත මණ්ඩලයේ අවස්ථාවෝචිත පරිදි ප්‍රධාන විධායක නිලධරයා හෝ මූලික විධායක නිලධරයා හෝ ප්‍රධාන පරිපාලන නිලධරයා ඇතුළු සෑම අධ්‍යක්ෂවරයකු සහ නිලධරයකු; හෝ

(ii) හවුල් ව්‍යාපාරයක් නම් ඒ හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවෙකු ම,

ඒ වරද සිදු කර ඇති බවට සළකනු ලැබිය යුතු යඃ

(ආ) අදාළ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් (අ) ඡේදය යටතේ මූල්‍ය විෂමාචාරයකට යටත් වන පුද්ගල මණ්ඩලයකට එරෙහිව වහාම විනය ක්‍රියාමාර්ග ගත යුතු ය:

එසේ වුව ද, ඒ වරද සිදු කරන ලද්දේ තම අනුදැනුම නොමැතිව බවට හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීමට අවශ්‍ය පරිදි නිසි උද්යෝගයෙන් තමා ක්‍රියා කළ බවට විනය පිළිබඳ අධිකාරිය සෑහීමට පත්වන ලෙස අවස්ථාවෝචිත පරිදි, යම් නිලධරයකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින් ඔප්පු කරන්නේ නම් ඒ නිලධරයා හෝ පුද්ගල මණ්ඩලය ඒ වරද සිදු කළ බවට සළකනු නොලැබිය යුතු ය.

අමාත්‍ය මණ්ඩලයට වාර්තා කිරීම

**65.** මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක අනනුකූලවීම නියම කර ඇති අවශ්‍යතාවයන් සමග අදාළ අමාත්‍යවරුන් සමඟ විෂය පථයට අයත් වන රාජ්‍ය අස්ථිත්වයක යම් අනුකූලව කටයුතු නොකිරීමක් ප්‍රධාන ගනන්දීමේ නිලධරයා විසින් එම අදාළ අමාත්‍යවරුන් හරහා අමාත්‍ය මණ්ඩලයට වාර්තා කළ යුතු ය.

## **XVI** වන කොටස

## විවිධ විධිවිධාන

වෙනත් නීතිවලට අනුකූල වීම

**66.** මේ පනතේ විධිවිධාන සහ ශ්‍රී ලංකාවේ මූල්‍ය කළමනාකරණය පාලනය වන වෙනත් යම් නීතියක විධිවිධාන අතර යම් ගැටුමක් හෝ අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු ය.

නියෝග

**67.** (1) මේ පනත මගින් නියම කරනු ලැබිය යුතු යයි නියමිත හෝ නියෝග සෑදිය යුතු යයි මේ පනත මගින් බලය දී ඇති කරුණු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ අන්තර්ගත විධිවිධානවලට අගතියක් නොමැතිව අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය:-

(අ) ඵලදායි ගෙවීම් පාලන පද්ධතියක් සඳහා වගකීම්වලට එළඹීම, ඒ සඳහා ගෙවීම් කිරීම සහ අනෙකුත් අවශ්‍යතාවයන් සම්බන්ධව;

(ආ) ගෙවිය යුතු හිඟ මුදල් වර්ගීකරණය කිරීම සම්බනන්ධව; සහ

(ඇ) ගෙවිය යුතු හිඟ මුදල් කළමනාකරණය කිරීම සහ පියවීම, ගෙවිය යුතු හිඟ මුදල් වාර්තා කිරීමේ අවශ්‍යතා, රාජ්‍ය ණය කළමනාකරණය කිරීමට අදාළ වන අදාළ ලිඛිත නීති යටතේ නියමිත වාර්ෂික ණය වාර්තාවට හිඟ මුදල් ඇතුළත් කිරීම සහ ගෙවිය යුතු හිඟ මුදල් පාලනයට අදාළ වෙනත් කරුණු සම්බන්ධව.

(3) මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලබන දින සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව දක්වනු ලබන වෙනත් යම් දිනයක සිට බලාත්මක විය යුතු ය.

(4) මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

(5) එසේ අනුමත නොකරන ලද සෑම නියෝගයක් ම, ඒ යටතේ නිසි පරිදි කලින් සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතු ය. යම් නියෝගයක් පරිච්ඡින්න කරන ලද දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(6) එම නියෝග සකස් කරන තුරු මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන්-

(අ) මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කර 1992 වර්ෂයේ පළ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් නියෝග;

(ආ) ජනාධිපති ලේකම්වරයා, භාණ්ඩාගාරයේ ලේකම්වරයා සහ මහ භාණ්ඩාගාරය යටතේ වූ දෙපාර්තමේන්තුන් හී ප්‍රධානීන් විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ; සහ

(ඇ) අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව අමාත්‍යංශ ලේකම්වරුන් විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ,

මේ පනතේ විධිවිධානවලට ඒ නියෝග සහ චක්‍රලේඛ අනනුකූල නොවන තාක් දුරට එම නියෝග සහ චක්‍රලේඛ දිගටම බලාත්මක වේ.

උපදෙස් හෝ විධාන නිකුත් කිරීමට ඇති බලය

**68.** (1) භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් ඒ විධාන මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය.

දුෂ්කරතා ඉවත් කිරීම

**69.** (1) මේ පනතේ හෝ මේ පනත යටතේ සාදනු ලබන නියෝගයක විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී යම් දුෂ්කරතාවයක් පැන නැගුනහොත්, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් දුෂ්කරතාව ඉවත් කිරීම සඳහා අවශ්‍ය හෝ අවස්ථානුකූල බවට සුදුසු අමාත්‍යවරයාට පෙනී යන පරිදි මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන සමග අනනුකූල නොවන යම් විධිවිධාන සාදනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට මාස තුනක් නොඉක්මවන දිනයක දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

## **XVII** වන කොටස

## ඉවත් කිරීම්

ඉවත් කිරීම්

**70.** (1) 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසෙ 8 වන සහ 14 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ.

1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ 8 වන සහ 14 වන වගන්ති ඉවත් කරනු ලැබේ.

(2) 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ ඉවත් කරන ලද 8 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව යම් රාජ්‍ය සංස්ථාවක් විසින් සකස් කරන ලද්දා වූ ද, මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ක්‍රියාත්මක වන්නා වූ ද යම් අයවැයක් මේ පනතේ 59 වන වගන්තිය යටතේ සකස් කරන ලද අයවැයක් ලෙස සළකනු ලැබිය යුතු ය.

(3) 2003 අංක 3 දරන දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

## XVIII වන කොටස

### අර්ථ නිරූපණය

අර්ථ නිරූපණය

**71.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ -

"ගණන්දීමේ නිලධරයා" යන්නට, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඇති අර්ථයම තිබිය යුතු ය;

"වාර්ෂික ක්‍රියාකාරී සැළැස්ම" යන්නෙන්, මුදල් වර්ෂයක් සඳහා රාජ්‍ය අස්ථිත්වයේ ඉලක්ක සහ ප්‍රමුඛතා සාක්ෂාත් කර ගැනීම සඳහා භාවිත කරන ක්‍රියා, ක්‍රියාකාරකම් සහ සම්පත් නිරූපණය කරන ලේඛනය අදහස් වේ;

"වාර්ෂික අයවැය" යන්නෙන් මුදල් වර්ෂයක් සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද අයවැයක් අදහස් වේ;

"විසර්ජන පනත" යන්නෙන්, ඒකාබද්ධ අරමුදලින් මුදල් ගෙවීම සඳහා පාර්ලිමේන්තුව විසින් සමාලෝචනය කර අනුමත කරන ලද පනතක් අදහස් වේ;

"ගෙවිය යුතු හිඟ මුදල්" යන්නෙන්, කල්පිරෙන දිනයේ දී මුදල් ගෙවා නැති මුදල් බැරකම් අදහස් වේ. කල් පිරෙන දිනය ලිඛිත නීතියක් මගින් හෝ ගිවිසුමක් මගින් නියම කර ඇති අතර කල්පිරීමේ දිනය ඉහත කී ක්‍රම මගින් විස්තර කර නැත්නම් කල් පිරීමේ කාලය වනුයේ අදාළ ඉන්වොයිස් පත්‍රයේ දින හෝ අදාළ කොන්ත්‍රාත්තුවේ නියමයන් සපුරාලීමේ දින සිට දින අනූවක් ගතවීම වේ;

"අයවැය අස්ථිත්ව" යන්නෙන් ආණ්ඩුවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ විශේෂ වියදම් ඒකක අදහස් වේ

"මහ බැංකුව" යන්නෙන්, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ;

"ප්‍රධාන ගණන්දීමේ නිලධරයා" යන්නට, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඇති ඊට දී අර්ථයම තිබිය යුතු ය;

"බැඳීම්" යන්නෙන්, වගකීමක් ඇති කර ගැනීමට පෙර ආණ්ඩුවක් ඉදිරිපත් කිරීමට අදාල කරන පරිපාලන ක්‍රියාවක් අදහස් වේ;

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අදහස් වේ;

"දෙපාර්තමේන්තුව" යන්නෙන්, ව්‍යවස්ථාපිතව හෝ පරිපාලනමය වශයෙන් නිශ්චිත විෂය ක්ෂේත්‍රයක් පවරා ඇති සහ වාර්ෂික අයවැය මගින් වැය ශීර්ෂයක් ලබා දී ඇති අස්ථිත්වයක් අදහස් වේ;

"විධාන"යන්නෙන්, මහා භාණ්ඩාගාරය හෝ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවක් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ, මාර්ගෝපදේශ හෝ විශේෂ විධාන අදහස් වේ;

"දිස්ත්‍රික් ලේකම් කාර්යාලය" යන්නෙන්, දිස්ත්‍රික්කයේ පරිපාලන සහ සංවර්ධන කාර්යය භාරව ඇති අස්ථිත්වයක් අදහස් වේ;

"බැහැර කිරීම" යන්නෙන්, විකිණීමක්, පැවරීමක්, පවරාදීමක් හෝ වෙනත් බැහැර කිරීමක් ඇතුළත් යම් තැනැත්තකු විසින් යම් දේපළක් විකිණීම හෝ බදු දීම ඇතුළු යම් ලැබිය යුතු යම් නෝට්ටු හෝ අයවීමක් හෝ ඒ සම්බන්ධිත යම් අයිතියක් හෝ හිමිකමක් නැවත ලබා ගැනීමක් ඇතිව හෝ නොමැතිව විකිණීම, පැවරීම, පවරා දීම, බලපත්‍ර දීම, බදු දීම හෝ වෙනත් බැහැර කිරීමක් අදහස් වේ;

"මුදල් වර්ෂය" යන්නෙන්, වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුවද එය නොතකා 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පිහිටුවන ලද රජයේ කොටස් සහිත සමගම් හැර ආණ්ඩුවේ සහ රජයේ අස්ථිත්වයන්හි මුදල් වර්ෂය සෑම වසරක ම ජනවාරි මස පළමු වන දින සිට මාස දොළහක් විය යුතු ය;

"මූල්‍ය අවදානම" යන්නෙන්, වාර්ෂික සහ බහු වාර්ෂික මූල්‍ය වැඩසටහන්වල පුරෝකථනයන්ගෙන් බැහැරවීමට හේතුවන මූල්‍ය ආදායමේ, වියදමේ, මූල්‍යත්වයේ වත්කම් සහ බැරකම් වල විචලනයක් ඇතිවීමට හේතුවිය හැකි සාධක හෝ සිදුවීම්; සහ එය වෙනත් හේතු අතර දේශීය හෝ විදේශීය සර්ව ආර්ථික තත්වයන්, රජයට අයත් ව්‍යවසාය මෙහෙයුම්, රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර ක්‍රියාත්මක කිරීම ස්වභාවික විපත් වලින්ද ඇති විය හැකි අවදානම් අදහස් වේ;

"ආණ්ඩුව" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අදහස් වේ;

"ඇපකරය" යන්නෙන්, යම් නිශ්චිත කොන්දේසි යටතේ වෙනත් නෛතික පුද්ගලයකුගේ හෝ අස්ථිත්වයක ගිවිසුම්ගත බැඳීම ඉටු කිරීම සහතික කිරීම සඳහා ඇපකරු ලෙස ආණ්ඩුව විසින් භාරගන්නා ලද පැහැදිළි වගකීමක් අදහස් වේ;

"වැය ශීර්ෂය" යන්නෙන්, විසර්ජන පනතට, වාර්ෂික අයවැයට සහ පරිපූරක ඇස්තමේන්තුවලට අදාළව -

(අ) අයවැය අස්ථිත්වයට ලැබෙන සම්පූර්ණ වියදම නිශ්චය කරන; සහ

(ආ) එක් එක් අස්ථිත්වයට වෙන් වශයෙන් පාර්ලිමේන්තුව විසින් කරනු ලබන, විසර්ජනයක්;

අදහස් වේ;

"බද්ද" යන්නෙන්, රජයේ ප්‍රාග්ධන ප්‍රදාන මත යම් අනුප්‍රමාණයකින් රාජ්‍ය සංස්ථාවක් විසින් ඒකාබද්ධ අරමුදලට කරන ලද ගෙවීමක් හෝ කලින් කලට අමාත්‍යවරයා විසින් තීරණය කළ හැකි යම් මුදල් ප්‍රමාණයක් ඒකාබද්ධ අරමුදලට ගෙවීමක් අදහස් වේ;

"මධ්‍ය කාලීන" යන්නෙන්, අවුරුදු තුනේ සිට අවුරුදු පහ දක්වා කාලයක් අදහස් වේ;

"මධ්‍ය කාලීන මූල්‍ය රාමුව" යන්නෙන්, එළඹෙන මුදල් වර්ෂය හා පසුව එළඹෙන මුදල් වර්ෂ හතරක් (පුරෝකථනය කරනු ලබන වර්ෂ) ආවරණය වන ආර්ථික උපකල්පන සහ මූල්‍ය පුරෝකථන සහ ඉලක්ක සමූහයක් අදහස් වේ;

"අධිකරණ සේවා සාමාජිකයන්" යන්නට, ශ්‍රේෂ්ඨාධිකරණ, අභියාචනාධිකරණ සහ මහාධිකරණ විනිශ්චයකාරවරයකු හෝ අධිකරණ නිලධරයකු හෝ විනිශ්චය සභාවක සාමාජිකයකු ඇතුළත් වේ;

"ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුව" යන්නෙන්, ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා දිගු කාලීන ඉලක්ක සහ මඟපෙන්වීම් ඇතුළත් වන තාර්කික සහ පුළුල් ව්‍යුහයක් අදහස් වේ;

"ජාතික ප්‍රතිපත්තිය" යන්නෙන්, ජාතික සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුවෙන් ජනිත වූ ප්‍රතිපත්ති අදහස් වේ;

"මූල්‍ය නොවන වත්කම්" යන්නෙන්, රාජ්‍ය අස්ථිත්වයක් විසින් සම්පූර්ණ අයිතිය දරන, පැවරීම සිදු කර ඇති, සන්තකය දරන, සතු වන, භාවිත කරන ලද හෝ බදු දී ඇති මූල්‍ය නොවන වත්කම් ලෙස ප්‍රකාශයට පත් කර ඇති වෙනස් වත්කම් සහ ඉඩම්, ගොඩනැගිලි ව්‍යුහයන්, කම්හල් සහ යන්ත්‍රෝපකරණ, වාහන, කාර්යාල උපකරණ සහ ගෘහභාණ්ඩ ඇතුළු නිෂ්පාදනය කරන ලද හෝ නිෂ්පාදනය නොකළ චංචල හෝ නිශ්චල දේපළ අදහස් වේ;

"ව්‍යවස්ථාපිත නොවන අරමුදල" යන්නෙන්, නීතියක් මගින් පිහිටුවනු නොලැබූ අරමුදල් අදහස් වේ;

"නිල බැංකු ගිණුම්" යන්නෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ හෝ වාණිජ බැංකුවක හෝ 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධාන යටතේ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක විවෘත කරනු ලැබුවා වූ ද නියෝග මගින් නියම කර ඇති පරිදි භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් බලය පවරන ලද රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට පහසුකම් සැලසීම සඳහා ක්‍රියාත්මක වන සහ පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුමක් අදහස් වේ;

"ප්‍රාථමික ශේෂය" යන්නෙන්, පොලී ගෙවීම් හැර රජයේ සමස්ත මුදල් ශේෂය අදහස් වන අතර ප්‍රාථමික ශේෂය ගණනය කිරීමේ දී රාජ්‍ය වත්කම් පෞද්ගලීකරණය කිරීමෙන් හෝ වාණිජකරණය කිරීමෙන් ලැබෙන ආදායම් ආණ්ඩුවේ ආදායමේ කොටසක් නොවිය යුතු අතර නැවත ප්‍රාග්ධනීකරණය සඳහා බැංකු හැර වෙනත් සංස්ථාවලට යොදවන ආණ්ඩුවේ කොටස් ආණ්ඩුවේ වියදම් ලෙස වාර්තාගත කිරීම අදහස් වේ;

"ප්‍රාථමික වියදම්" යන්නෙන්, මුදල් වර්ෂයක දී ණය සේවා හැර ආණ්ඩුවේ සම්පූර්ණ වියදම් අදහස් වේ;

"නියම කරන ලද යන්නෙන්, නියෝග මගින් නියම කිරීම අදහස් වේ;

"ජනාධිපතිවරයා" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා අදහස් වේ;

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154අ ව්‍යවස්ථාව ප්‍රකාරව පළාතක් සඳහා පිහිටුවා ඇති පළාත් සභාවක් අදහස් වේ;

"රාජ්‍ය සංස්ථා" යන්නට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාව යටතේ එම යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුත්තේ ය;

"රාජ්‍ය ණය" යන්නට, ණය ගැනීම මගින් සහ 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ නිශ්චිතව දක්වා ඇති අස්ථිත්වවල ණය මගින් උත්පාදනය වන ආණ්ඩුවේ වගකීම් අදහස් වේ;

"රාජ්‍ය මූල්‍ය" යන්නට -

(අ) අදාළ වර්ෂයේ විසර්ජන පනත මගින් 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති යම් රාජ්‍ය අස්ථිත්වයකට වෙන් කරන ලද අරමුදල්;

(ආ) සකසුරුවම, ඉතිරි කිරීම හෝ සමාජය ගොඩනැගීම ඇතුළුව අනුමත අවසන් කිරීමේ අරමුදල් හෝ සේවා නියුක්තයන් විසින් දායක වනු ලබන සුබසාධන අරමුදලක් හෝ, අදාළ ලිඛිත නීතිය යටතේ සේවා නියුක්තයන්ගේ සේවය අවසන් කිරීමේ දී පාරිතෝෂික දීමනා ගෙවීමේ කාර්යය සඳහා පවත්වාගෙන යනු ලබන යම් පාරිතෝෂික අරමුදලක් හැර යම් ලිඛිත නීතියක් අනුව 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති රාජ්‍ය අස්ථිත්වයක් විසින් දරන අරමුදල්;

(ඇ) යම් ලිඛිත නීතියක විධිවිධාන ප්‍රකාරව ආණ්ඩුව වෙත පවරා ඇති අරමුදල්; සහ

(ඈ) පාර්ලිමේන්තුවේ අනුමතිය ඇතිව 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති යම් රාජ්‍ය අස්ථිත්වයකට ලැබී ඇති හෝ ණයට ගත් අරමුදල්,

අදහස් වේ;

"රජයේ අරමුදල්" යන්නෙන්, සැකසුරුවම, ඉතිරි කිරීම හෝ සමාජය ගොඩනැගීම ඇතුළු අනුමත අවසන් කිරීමේ අරමුදල් හෝ සේවා නියුක්තයන් විසින් දායක වනු ලබන සුබසාධන අරමුදලක් හෝ, අදාළ ලිඛිත නීතිය යටතේ සේවා නියුක්තයන්ගේ සේවය අවසන් කිරීමේ දී පාරිතෝෂික දීමනා ගෙවීමේ කාර්යය සඳහා පවත්වාගෙන යනු ලබන යම් පාරිතෝෂික අරමුදලක් හැර ඒකාබද්ධ අරමුදලේ හෝ වෙනත් යම් අරමුදලක හෝ රජයේ පාලනයේ ඇති මුදල් අදහස් වේ;

"රාජ්‍ය ආයෝජන වැඩසටහන" යන්නෙන්, ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුව මත පදනම් ව සකස් කරන ලද දැනට ක්‍රියාත්මක සහ යෝජිත සියලුම රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති සහ රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර ව්‍යාපෘතිවලින් සමන්විත මධ්‍යකාලීන චක්‍රිය සැලැස්මක් අදහස් වේ;

"රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති" යන්නෙන්, පුරවැසියන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමට, ආර්ථිකය වර්ධනය කිරීමට හා සමාජ අවශ්‍යතා සපුරාලීමට රාජ්‍ය වත්කම් හෝ සේවා සංවර්ධනය කිරීම, වැඩි දියුණු කිරීම හෝ පවත්වාගෙන යාම සඳහා මූල්‍ය සම්පත්, භෞතික සම්පත් හෝ සේවාවන් වෙන් කිරරිම අරමුණු කරගත් රාජ්‍ය, පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් මගින් අරමුදල් සපයන ඒකාබද්ධ ක්‍රියාකාරකම් සමූහයක් අදහස් වේ;

"රාජ්‍ය නිලතල දරන්නකු" යන්නෙන්, උපදේශන හෝ පරිපාලන කාර්යයක් පැවරී ඇති ආයතනයකට ආණ්ඩුව විසින් පත් කරනු ලබන රජයේ වැටුප් ලබන්නකු අදහස් වේ;

"රජයේ නිලධරයා" යන්නට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාව මගින් දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර" යන්නෙන්, පුද්ගලික පාර්ශ්වයක් විසින් සැලකිය යුතු අවදානමක් සහ

කළමනාකරණ වගකීමක් දරන රාජ්‍ය වත්කමක් හෝ සේවාවක් සැපයීම සඳහා පෞද්ගලික පාර්ශ්වයක් හා ආණ්ඩුවේ අස්ථිත්වයක් අතර ඇති කරගන්නා දීර්ඝ කාලීන ගිවිසුමක් අදහස් වේ;

"අදාළ අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ රාජ්‍ය අස්ථිත්වයේ විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"ආදායම් ගනන් දීමේ නිලධරයා" යන්නෙන්, වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් පවරන ලද අයවැය සංකේතවල වාර්ෂික ආදායම් ඇස්තමේන්තු සැකසීම සඳහා පහසුකම් සැලසීමේ වගකීම පැවරී ඇති සහ ඇස්තමේන්තුවේ සහ සත්‍ය එකතු කිරීම් අතර ඇති වෙනස පිළිබඳව වගවිය යුතු නිලධරයකු අදහස් වේ;

"විශේෂ වියදම් ඒකකය" යන්නෙන්, අමාත්‍යංශය, දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හෝ පළාත් සභාව හැර වාර්ෂික අයවැය මගින් වැය ශීර්ෂයක් ලබා දී ඇති අස්ථිත්වයක් අදහස් වේ.

"රජයට අයත් ව්‍යවසාය" යන්නෙන්, ශ්‍රී ලංකා මහා බැංකුව සහ ස්වකීය ව්‍යාපාරයේ කොටසක් හෝ සමස්ත ව්‍යාපාරය ලෙසට ණය දීමේ හෝ ණයට ගැනීමේ කාර්යයේ නිරතව සිටින රක්ෂණ සහ කල්බදු මූල්‍යකරණ සමාගම් ඇතුළු මූල්‍ය ආයතන හැර-

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අර්ථානුකූල රාජ්‍ය සංස්ථාවක් ;

(ආ) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පිහිටුවා ක්‍රියාත්මක කරන අස්ථිත්වයන් අදහස් වන අතර එහි දී රජය සතු කොටස් හිමිකාරීත්වය අනුව සෘජු හෝ වක්‍ර පාලනයක් රජයට ඇති; හෝ

(ඇ) 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ පරිවර්තනය කරන ලද රජයට අයත් සංස්ථා, හෝ වෙනත් පනතක් අනුව ආණ්ඩුවට පවරා ඇති යම් ව්‍යාපාරික අස්ථිත්වයක්,

අදහස් වේ;

"ව්‍යවස්ථාපිත අරමුදල්" යන්නෙන්, සකසුරුවම, ඉතිරිකිරීම හෝ සමාජය ගෙඩනැගීම ඇතුළු අනුමත අවසන් කිරීමේ අරමුදල් හෝ සේවා නියුක්තයන් විසින් දායක වනු ලබන සුබසාධන අරමුදලක් හෝ, අදාළ ලිඛිත නීතිය යටතේ සේවා නියුක්තයන්ගේ සේවය අවසන් කිරීමේ දී පාරිතෝෂික දීමනා ගෙවීමේ කාර්යය සඳහා පවත්වාගෙන යනු ලබන යම් පාරිතෝෂික අරමුදලක් හැර රාජ්‍ය මුදල් වෙන් කර ඇති ඒකාබද්ධ අරමුදල නොවන පාර්ලිමේන්තුවේ පනතක් මගින් හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් විශේෂ කාර්යයක් සඳහා නිර්මාණය කරන ලද හෝ පිහිටුවන ලද යම් අරමුදලක් අදහස් වේ;

"බදු වියදම්" යන්නට, නිදහස් කිරීම්, දීමනා, බදු අනුපාත සහන සහ බදු කල් දැමීම් සහ විලම්භයක් ඇතුළත් වේ;

"භාරය" යන්නට, 1917 අංක 9 දරන භාර ආඥා පනතේ 3 වන වගන්තියේ සඳහන් අර්ථය ම තිබිය යුතුය;

"අතුරු සම්මත ගිණුම" යන්නෙන්, විසර්ජන පනතක් නොමැති අවස්ථාවක දී උපරිම මාස හතරක් සඳහා රජයේ සේවා සහ සංවර්ධන කටයුතු පවත්වාගෙන

යාම සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද රජයේ වියදම් ඇස්තමේන්තුවක් අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව

**72.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.